1.7.3. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අර්ථනිරූපනය කර ඇති දායක සැලසුම් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල
අදාල ව්‍යවස්ථාපිත සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා සුදුසුකම් ලබයි.

1.7.3 රජයේ ප්‍රදාන සහ සහනාධාර

(අ) සිය වියදම් සඳහා ආයතනය බලාපොරොත්තුවන්නාවූ රජයේ ප්‍රදාන ගිණුම්ගත කරනු ලබන්නේ ඒවා ලැබෙන පදනමිනි. පුනරාවර්තන හා ගිණුම්වලට අදාළ වියදම් ඉදිරිපත් කරනු ලබන්නේ ආදායම් සහ වියදම් ගිණුමේ බැරට වන අතර මුලධන වියදම් වැය අදාල ප්‍රදාන මුලධන ප්‍රාග්ධන ගිණුමට බැර කරන ලදී.

(ආ) ආරම්භයේ දී වත්කම් වලට අදාළව ප්‍රදාන ආයතන වෙතින් ලද ප්‍රදාන ඒවා ප්‍රයෝජනයට ගන්නා තෙක් වගකීම් ලෙස පිළිගෙන ඇත. ප්‍රදානයෙන් ප්‍රයෝජනයට ලබා ගන්නා ලදමුදල සමුච්චිත ආදායම් ප්‍රදානයට මාරුකර ඉන්පසුව වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය තුලදී ක්මක්ෂය කරන ලදී.

1.7.5. ප්‍රතිපාදන සහ අසම්භාව්‍ය වගකීම්

ශේෂපත්‍ර දිනය වන විට පවත්නා සියළු වගකීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර එසේ කරනු ලබන්නේ එවැනි වගකීමක් සම්පත් ප්‍රවාහයකට හේතු විය හැකි අවස්ථාවලදී සහ එම ප්‍රවාහයෙහි ප්‍රමාණය අනුව විශ්වාසදායක ඇස්තමේන්තුවක් පිළියෙල කළ හැකි විටදීය.
සම්පත් ප්‍රවාහය අසලක නොවන්නේ නම් සියලු අසම්භාව්‍ය වගකීම් මුල්‍ය වාර්තාවන්හි සටහන 27 යටතේ හෙලිදරව් කරනු ඇත.

1.8 ආදායම් සහ වියදම් ප්‍රකාශය

1.8.1 ආදායම හඳුනාගැනීම
ආදායම හදුනාගනු ලබන්නේ ආර්ථික ප්‍රතිලාභ අධිකාරියට ගලා ඒමට හැකිතාක් දුරට සහ ආදායම සහ උපචිත වූ සහ උපචිත විය හැකි පිරිවැය විශ්වාසදායක අන්දමට මැනබැලිය හැකි අවස්ථාවන්හිදීය. ආදායම මැන බලනු ලබන්නේ ලැබී ඇති සහ ලැබිය හැකි සාධාරණ වටිනාකම අනුවය.
ආදායම හදුනාගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්නායකයන් භාවිතා කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වියදම් සඳහා ලැබී ඇති ප්‍රදාන.
පුනරාවර්තන වියදම් සඳහා මහ භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ප්‍රදාන ආදායම ලෙසට හදුනා ගනු ලැබේ.

(ආ) ආරම්භයේදී ආධාර ලබාදෙන ආයතන මගින් ලැබෙන ප්‍රදාන ඒවා භාවිතයට ගන්නා තුරු හදුනාග නු ලබන්නේ වගකීම් වශයෙනි. ප්‍රදානයෙන් ප්‍රයෝජනයට ගනු ලබන මුදල් ප්‍රමාණය ආදායමට මාරු කරනු ලැබේ.

(ඇ) පුහුණු පාඨමාලාවලින් ලැබෙන ආදායම
පුහුණු පාඨමාලා ගාස්තු සඳහා වන ආධුනික ගාස්තුව හදුනාගනු ලබන්නේ උපචිත පදනමිනි.

(ඈ) ආධුනික පාඨමාලා වලින් ලැබෙන ආදායම්

ආධුනිකයන් මඟින් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්-න් උපචිත පදනමිනි.

(ඉ) කුලී ආදායම

කුලී ආදායම හදුනාගනු ලබන්නේ බදු කාල සීමාව පදනම් කර ගනිමින.

(ඊ) අනිකුත් ආදායම් හදුනාගනු ලබන්නේ උපචිත පදනමිනි.

1.8.2 වියදම් හඳුනාගැනීම
ආදායම් සහ වියදම් ගිණුමේ දී වියදම්
හදුනාගනු ලබන්නේ උපචිත වූ පිරිවැය සහ නිශ්චිත අයිතමයන්ගේ ඉපැයීම් පිළිබඳ සෘජු සහභාගිත්වයේ පදනමින. **VTASL** පවත්වා ගෙන යාමේදී සහ දේපල, යන්ත්‍රෝපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමේදී දැරීමට සිදුවන සියලුවියදම්, වර්ෂය සඳහා අතිරික්තය හෝ ඌණතාවය සලකා බැලීමේදී ආදායමට එකතු කරඇත.

මූල්‍ය ප්‍රකාශයන් සඳහා සටහන

දේපල, පිරියත සහ උපකරණ										රුපියල් වලින්
	ඉඩම්	ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම්	මෝටර් වාහන	ගෘහභාණ්ඩ සහ සවි කිරීම්	පුහුණු උපකරණ	කාර්යාල උපකරණ	විදුලි උපකරණ	පරිගණක උපකරණ	දේපල සහ පිරියත	එකතුව
වියදම් හෝ තක්සේරු කිරීම										
වර්ෂය ආරම්භයේ	1,753,908,921.24	3,142,245,626.52	292,781,740.58	257,794,321.28	1,779,723,992.39	90,871,020.64	8,644,825.81	405,795,527.38	85,464,051.81	**7,817,230,027.65**
වර්ෂය තුළ එකතු වීම්	4,849,805.20	189,499,694.18	5,798,657.85	14,942,236.90	162,731,997.90	24,021,720.30		60,486,652.46	6,442,143.46	**468,772,908.25**
වර්ෂය අවසානයේ	**1,758,758,726.44**	**3,331,745,320.70**	**298,580,398.43**	**272,736,558.18**	**1,942,455,990.29**	**114,892,740.94**	**8,644,825.81**	**466,282,179.84**	**91,906,195.27**	**8,286,002,935.90**
සමුච්චිත ක්ෂය වීම										
වර්ෂය ආරම්භයේදී	0.00	824,598,506.20	211,752,455.92	102,234,957.95	1,052,338,817.21	37,646,450.32	4,624,200.59	266,565,686.69	59,161,919.29	**2,558,922,994.17**
වර්ෂය සඳහා අය කිරීම	0.00	125,357,340.73	21,706,985.63	17,050,160.02	178,023,434.62	7,724,629.06	914,465.44	39,943,298.63	6,548,855.20	**397,269,169.33**
වර්ෂය අවසානයේ	**0.00**	**949,955,846.93**	**233,459,441.55**	**119,285,117.97**	**1,230,362,251.83**	**45,371,079.38**	**5,538,666.03**	**306,508,985.32**	**65,710,774.49**	**2,956,192,163.50**
ඇප හරිත ලද අගයන්										
2016.12.31 දිනට	**1,758,758,726.44**	**2,381,789,473.77**	**65,120,956.88**	**153,451,440.21**	**712,093,738.46**	**69,521,661.56**	**3,106,159.78**	**159,773,194.52**	**26,195,420.78**	**5,329,810,772.40**
2015.12.31 දිනට	**1,753,908,921.24**	**2,317,647,120.32**	**81,029,284.66**	**155,559,363.33**	**727,385,175.18**	**53,224,570.32**	**4,020,625.22**	**139,229,840.69**	**26,302,132.52**	**5,258,307,033.48**

මූල්‍ය වර්ෂ කවසන්

2.2 තක්සේරු කොමිටිය විසින් ඉඩම් හා ගොඩනැගිලි

1. ඉහත සඳහන් වෙන්දේසි ප්‍රසිද්ධ කරවන්නන්ගේ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර තොමැති බැවින් ඒවා වර්ෂය තුළදීම් විකුණා හරින ලෙස නියෝග කර ඇත.

- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය තිහාරිගම - ගම්බර
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය අත්තිමන - ගම්බර
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය වතුරවිල - ගම්බර
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය යක්කලමුල්ල - ගම්බර
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය මාතලේ - මාතලේ
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය කටාන - ගම්පහ
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය කිරිබත්ගොඩ - කම්බත්ගොට
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය කිරිබත්ගොඩ - කම්බත්ගොට

ඉහත ඉඩම් සහ ගොඩනැගිලි වල තක්සේරු කිරීම් සිදුකරමින් පවතින අතර ඒවායෙහි අගය 2017 වර්ෂයේදී ගිණුම්ගත කරනු ඇත.

2. පහත සඳහන් ගොඩනැගිලි ඉදිකර ඇත්තේ වෙන්දේසි ප්‍රසිද්ධ අධිකාරියට අයත් නොවන ඉඩම් වල නිසලතා සංවර්ධන වාසෙකය මත වූ අරමුදල් වලිනි. ඉහත ඉඩම් සහ ගොඩනැගිල්ල් තක්සේරුව 2017 වර්ෂයේදී ඇතුළත් කරනු ඇත.

- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය හිංගිරිය - කුරුණෑගල
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය මොරගහහේන - ගම්පහ
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය යක්කලමුල්ල - ගාල්ල
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය රුවන්වැල්ල - කෑගල්ල
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය කන්තලේ - පොළොන්නරුව
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය කම්බත්ගොට - කම්බත්ගොට
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය එක්කුඹුර - කළුතර
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය කල්දමුල්ල - බදුල්ල
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය වැලිමඩ - බදුල්ල
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය වැල්ලවාය - මොණරාගල
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය බිබිල - මොණරාගල
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය මිහින්තලේ - අනුරාධපුරය
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය තලාව්ගම - අනුරාධපුරය
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය මිරිස්ගොඩිය - පොළොන්නරුව
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය යටියන්නොට - කෑගල්ල
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය කිලිනොච්චිය - යාපනය
- වෙන්දේසි ප්‍රසිද්ධ මධ්‍යස්ථානය රත්මලාන - කොළඹ

මූල්‍ය ප්‍රකාශයන් සඳහා සටහන්

		සටහන	2016		2015
			රු.		රු.
3	වැඩ කෙරෙමින් පවතින ගොඩනැගිලිවල ප්‍රාග්ධනයන්				
	අම්පාර		99,442.00		13,317,157.42
	අනුරාධපුරය		3,216,293.70		390,637.50
	බදුල්ල		475,778.37		19,064,397.56
	මඩකලපුව		158,850.00		158,850.00
	කොළඹ		4,108,793.41		1,714,442.53
	ගම්පහ		5,113,792.27		339,733.50
	ගාල්ල		17,511,596.07		3,405,037.56
	හම්බන්තොට		18,893,980.70		18,258,018.77
	යාපනය		4,881,477.70		37,148,386.74
	මහනුවර		651,415.23		
	කළුතර		4,556,090.07		3,964,497.60
	කෑගල්ල		4,451,260.57		
	කුරුණෑගල		5,892,496.36		221,247.00
	මාතර		273,395.00		17,729,439.62
	මොණරාගල		5,970,380.77		
	නුවර එළිය		7,965,454.41		13,049,580.77
	රත්නපුරය		6,009,054.86		158,920.50
			90,229,551.49		**128,920,347.07**
4	ආයෝජනයන්				
	පුහුණු ද්‍රව්‍ය		21,916,262.21		22,353,518.82
	ලිපිද්‍රව්‍ය		5,904,978.19		7,149,429.29
	අනෙකුත් පරිභෝජනයන්		749,033.57		823,384.20
			28,570,273.97		**30,326,332.31**
5	ලැබීම්				
	වැඩසටහන් සඳහා අත්තිකාරම්		344,105.00		82,000.00
	තැන්පතු		559,750.00		409,750.00
	ජාත්තිය පුහුණු අමාත්‍යාංශය		3,930,931.24		3,930,931.24
	පූර්ව ගෙවීම්				
	පාඨමාලා ගාස්තු ලැබීම්		19,458,199.10		14,683,894.10
	වැටුප් ලැබීම්		679,882.55		1,173,934.93
	ආදායමේ ඌණතාවයන්		11,732.00		11,732.00
	රාජ්‍ය සංවිධාන		3,035,710.16		3,035,710.16
	වෙළඳ හා වෙනත් ලැබීම්		11,266,498.70		10,977,338.20
	වාහන සේවා ආදායම් ලැබීම්		461,405.00		519,749.00
			39,748,213.75		**34,825,039.63**
	අඩු කළා : බොල් ණය සඳහා ප්‍රතිපාදන		**(6,966,641.40)**		**(6,966,641.40)**
			32,781,572.35		**27,858,398.23**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

		Note	2016		2015
			Rs.		Rs.
6	සේවක ණය				
	වර්ෂය ආරම්භයේ ශේෂය		45,363,743.66		47,087,942.80
	අඩු කළා : ආරම්භක ශේෂ ගැළපීම්				
	නැවත සඳහන් කළ පරිදි ශේෂය		45,363,743.66		47,087,942.80
	එකතු කළා: වර්ෂය තුළ ප්‍රදානය කළ ණය		45,279,105.65		43,771,473.41
			90,642,849.31		90,859,416.21
	අඩු කළා: වර්ෂය තුළ නැවත ගෙවීම්		(45,804,667.90)		(45,495,672.55)
	වර්ෂය අවසානයේ ශේෂය		**44,838,181.41**		**45,363,743.66**
7	මුදල් සහ මුදල් සමාන දෑ				
	සංක්‍රමණික මුදල්				
	රන් කාසි		104,000.00		104,000.00
	බැංකුවේ පවතින මුදල්				
	ලංකා බැංකුව				67,165.71
	අතැති මුදල්		35,545.00		27,313.00
	අතැති චෙක්පත්		487,160.00		-
	කොමර්ෂල් බැංකුව				731,357.25
	මහජන බැංකුව		157,858,418.25		89,807,163.07
			158,485,123.25		**90,736,999.03**
7.1	සෙලාන් බැංකුවේ තැගි ලෙස රන්කාසි 02 ක් අධිකාරිය වෙත ලැබුණි. එක් රන්කාසියක බර ග්‍රෑම් 8.02 වන අතර එක් රන් කාසියක වටිනාකම් කැරට් 22.03 කි.				
8	රජයේ ප්‍රාග්ධන ප්‍රදාන				
	වර්ෂය ආරම්භයේ ශේෂය		36,138,943.05		19,253,677.14
	අඩු කළා: ආරම්භක ශේෂ ගැළපීම්				(756,116.50)
	නැවත සඳහන් කළ පරිදි ශේෂය		36,138,943.05		18,497,560.64
	එකතු කළා : වර්ෂය තුළ ලද ප්‍රදානයන්		111,500,000.00		121,500,000.00
			147,638,943.05		139,997,560.64
	අඩු කළා:වෙනස් කළ ආදායම් ප්‍රතිපාදනවලට මාරු කිරීම්		(106,565,910.19)		(103,858,617.59)
	වර්ෂය අවසානයේ ශේෂය		**41,073,032.86**		**36,138,943.05**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		සටහන	2016		2015
			රු.		රු.
9	**කල්දැමූ ආදායම් ප්‍රතිපාදන**				
	වර්ෂය ආරම්භයේ ශේෂය		3,492,008,442.35		3,486,332,412.03
	එකතු කළා : ආරම්භක ශේෂ ගැලපීම				1,084,523.56
	නැවත සඳහන් කළ පරිදි ශේෂය		3,492,008,442.35		**3,487,416,935.59**
	එකතු කළා : වර්ෂය තුළ මාරු කිරීම්	9.1	430,086,022.29		401,015,353.47
			3,922,094,464.64		**3,888,432,289.06**
	අඩු කළා : වසර සඳහා ක්‍රමක්ෂය		(397,269,169.33)		(396,423,846.71)
	වර්ෂය අවසානයේ ශේෂය		**3,524,825,295.31**		**3,492,008,442.35**
9.1	**කල් දැමූ ආදායමට මාරු කිරීම්**				
	රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්		106,565,910.19		103,858,617.59
	SSDP ප්‍රදානයන්		261,642,279.75		297,156,735.88
	වෙනත් ප්‍රතිපාදන		61,877,832.35		
			430,086,022.29		**401,015,353.47**
10	**පාරිතෝෂිකයන් සඳහා ප්‍රතිපාදන**				
	වර්ෂය ආරම්භයේ ශේෂය		373,823,908.00		282,918,383.10
	එකතු කළා : ආරම්භක ශේෂ ගැලපුම		(56,687,929.47)		352,844.00
	නැවත සඳහන් කළ පරිදි ශේෂය		317,135,978.53		283,271,227.10
	එකතු කළා: වර්ෂය තුළ ලද ප්‍රතිපාදන				**99,277,549.20**
			317,135,978.53		**382,548,776.30**
	අඩු කළා: වර්ෂය තුළ ගෙවීම්		**(10,984,024.03)**		(8,724,868.30)
	වර්ෂය අවසානයේ ශේෂය		**306,151,954.50**		**373,823,908.00**

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

		සටහන	2016		2015
			රු.		රු.
11	**ගෙවීම්**				
	විගණන ගාස්තු		993,435.00		1,924,000.00
	අයකැමී තැන්පතු		25,000.00		25,000.00
	පාඨමාලා ගාස්තු ගෙවීම්		4,047,151.40		451,740.00
	තැන්පතු		128,500.00		67,000.00
	සේවක අර්ථ සාධක අරමුදල		15,515,306.90		14,175,314.95
	සේවක භාරකාර අරමුදල		2,327,296.34		2,126,296.84
	කණිකාචාර්ය ගාස්තු		3,091,600.00		1,794,325.00
	වෙනත් ගෙවීම්		11,849,030.05		7,170,060.80
	ව්‍යාපෘති ආධාර ගෙවීම්		21,028,772.00		10,427,341.81
	අත්තිකාරම් ලැබීම්		798,200.00		646,095.00
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		2,049,356.51		1,888,531.29
	රඳවා ගත් මුදල්		23,928,862.47		15,473,297.26
	වැටුප් ගෙවීම්		287,607.05		449,003.43
	කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම්		38,200.00		251,903.65
	ශිෂ්‍ය රක්ෂණ ක්‍රමය	11.1	38,354,000.00		24,905,500.00
	වෙළඳ ණය ගැතියන්		3,691,563.32		7,639,520.77
	ජංගම දුරකථන සඳහා වෙන් කිරීම්		1,818,537.09		1,264,640.15
	වැන්දඹුවට හා අනත් දරු		106,100.56		96,207.76
			130,078,518.69		90,775,778.71
11.1	**ශිෂ්‍ය රක්ෂණ ක්‍රමය**				
	වර්ෂය ආරම්භයේ		24,905,500.00		12,309,000.00
	එකතු කළා : වර්ෂය තුළ දායකත්වයන්		13,948,500.00		12,604,000.00
			38,854,000.00		24,913,000.00
	අඩු කළා: වර්ෂය තුළ ගෙවීම්		(550,000.00)		(7,500.00)
	වර්ෂය අවසානයේ ශේෂය		39,404,000.00		24,905,500.00

	මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්				
		සටහන	2016		2015
			රු.		රු.
12	උපචිත වියදම්				
	රැකියා මාර්ගෝපදේශනය		171,190.00		183,020.00
	විදුලි බලය		2,188,615.30		2,317,337.56
	විභාග සහ ඇගයීම්		677,400.00		207,482.00
	ඉන්ධන සහ ලිහිසි තෙල්		8,903.00		48,948.00
	සනීපාරක්ෂක සේවා		602,937.40		717,379.00
	නඩත්තු කිරීම්		2,017,703.72		1,414,185.50
	සුවඳ්ෂන් සහ වාර සංග්‍රහ		30,760.00		35,825.00
	සේවාස්ථ සුහුණුව සඳහා ගෙවීම්		42,500.00		536,250.00
	අතිකාල සහ නිවාඩු දින ගෙවීම්		1,052,956.89		863,678.49
	අර්ධ කාල වියදම් ගෙවීම්		4,931,902.90		4,852,415.00
	ප්‍රවර්ධන කටයුතු		3,236,096.57		495,554.56
	කුලී, වරිපනම් සහ බදු		334,468.17		213,900.00
	වාර ප්‍රවේශ ගාස්තු		781,266.90		545,083.75
	ආරක්ෂක සේවා ගාස්තු		3,794,772.20		4,046,400.00
	දීමනා		1,869,300.00		1,535,500.00
	දුරකථන		2,750,772.62		1,887,616.47
	ප්‍රවාහනය		65,900.00		77,800.00
	ගමනාගමන		524,881.95		550,308.80
	ජලය		263,779.65		459,083.55
			25,346,107.27		20,987,767.68

	මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
		සටහන	2016		2015
			රු.		රු.
13	වෙනත් ආදායම්				
	වෙන්දේසි ආදායම්		2,147,364.50		415,250.00
	පාඨමාලා ගාස්තු		131,818,200.00		119,485,750.00
	ආපන ශාලා ආදායම්		235,900.00		220,000.00
	සමාගම් ලියාපදිංචි කිරීම්		54,000.00		108,500.00
	දෛනික වැඩ ලේඛන		3,225,000.00		2,951,000.00
	ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්		66,000.00		82,000.00
	දඩ		61,956.00		69,956.00
	ශාලා ආදායම්		2,005,430.00		1,590,800.00
	නෝවාසිකාගාර ගාස්තු		223,500.00		414,500.00
	කහරගම සංචාරක බංගලාව		446,585.00		446,275.00
	ණය වාරික		1,765,256.36		1,857,567.05
	විවිධ		2,219,406.44		3,373,791.10
	ආසන්න හොඟෙවන ලද චෙන්ඩර් තැන්පතු		791,500.00		283,377.40
	වර්ථා පොත්		5,629,600.00		5,137,100.00
	ලියාපදිංචි ගාස්තු		8,952,300.00		8,158,800.00
	විකිණීම් අවසන් හෂණ්ඩ		287,098.75		202,650.00
	ඉතුරුම් ගිණුම් පොලි		1,455,361.83		808,669.61
	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්		519,400.00		7,000.00
	ඉංග්‍රීසි පොත් ආදායම්		607,200.00		
			162,511,058.88		145,612,986.16

	මූල්‍ය ප්‍රකාශනා සඳහා සටහන්				
		සටහන	2016		2015
			රු.		රු.
14	නිෂ්පාදන ඒකක ආදායම්				
	සේවක සංවර්ධන මධ්‍යස්ථානය - අනුගමිකත්ව		-		1,931,075.50
	ඉපයීම් 10%		594,733.25		664,095.70
	අර්ධ කාලීන පාඨමාලාවලින් ආදායම්		8,098,127.27		9,688,681.47
	මුද්‍රණ පාසල - නාරාහේන්පිට		1,655,574.82		-
	පෙර ඉගෙනුම් හඳුනා ගැනීම (PRL)		5,257,709.43		1,541,601.10
	සිඤ්ඤල බොඞ්ගුව් - නාරාහේන්පිට		16,446.50		74,157.37
	විවිධ ආදායම්		-		159,957.80
	නිපුණතා පරීක්ෂණ		16,500.00		54,688.67
	තලල්ල රෙස්ට්‍රැරන්ට්		107,906.75		234,365.21
	වී - ෂර්ට් ආදායම්		181,450.00		1,169,540.80
	වාහන සේවා		108,360.05		55,327.00
	වෙනත් නිෂ්පාදන ආදායම්		617,859.98		-
			16,654,668.05		15,573,490.62

	මූල්‍ය ප්‍රකාශනායන් සඳහා සටහන්				
		සටහන	2016		2015
			Rs.		Rs.
15	විශේෂ ව්‍යාපෘති සඳහා ආධාර				
	යෞවන කවයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - උසස් පෙළ සිසුන් සඳහා වැඩසටහන		130,725.00		2,170,119.25
	ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන		153,114,359.42		114,270,351.26
	GIZ ආධාර		609,531.99		-
	ILO ආධාර		5,114,231.17		-
	අයවැය යෝජනාවල ආධාර		23,608,531.18		-
	WUSC ව්‍යාපෘතියේ ආධාර		865,256.00		-
	යෞවන කවයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - ලෝක නිපුණතා දිනය		-		53,025.00
	ලංකා විදුලි බල මණ්ඩලය		-		1,776,368.50
			183,442,634.76		118,269,864.01
16	කාර්ය මණ්ඩල වියදම්				
	E.P.F. & E.T.F.		166,084,956.43		102,487,074.83
	පාරිතෝෂික අධිභාරය		-		76,818.75
	වෙනත් දීමනා		404,872,812.05		433,998,896.67
	වැටුප් සහ අතිකාල		458,799,988.26		381,472,962.66
	කාර්ය මණ්ඩල පාරිතෝෂිකය		0.00		99,277,549.20
			1,029,757,756.74		1,017,313,302.11

	මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
		සටහන	2016		2015
			Rs.		Rs.
17	ගම්‍යාගම්‍යතා				
	නවාතැන් වියදම්		653,293.00		463,426.00
	දේශීය		7,370,473.58		6,877,069.56
	විදේශීය		3,040,313.57		4,473,001.30
	වියදම් වර්ගීකරණය		1,571,868.15		284,147.96
			12,635,948.30		12,097,644.82
18	සැපයුම් සහ වෙනත් පරිභෝජනයන්				
	ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය		13,553,344.51		13,258,538.90
	වෙනත්		2,017,800.99		1,673,172.20
	ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා		10,249,669.23		8,935,643.40
	මුද්‍රණ ද්‍රව්‍ය		5,379,687.00		
			31,200,501.73		23,867,354.50
19	නඩත්තු සේවා				
	ගොඩනැගිලි		10,426,012.39		12,013,289.13
	දේපල සහ ඉරියහ		9,515,292.54		8,555,592.18
	වාහන		14,205,900.13		11,884,404.68
			34,147,205.06		32,453,285.99
20	ගිවිසුම්ගත සේවා				
	වෙළඳ දැන්වීම්		4,429,622.25		2,322,323.70
	විගණන ගාස්තු		500,000.00		500,000.00
	වන්දි		-		313,794.00
	විදුලි බලය		47,614,556.80		44,753,916.95
	කුලී ගාස්තු		400,000.00		240,000.00
	රක්ෂණය		2,779,876.62		4,579,745.90
	සනීපාරක්ෂක සේවා		8,755,895.04		9,554,281.82
	සුවඳ්පත් සහ වාර සංග්‍රහ		485,743.00		397,978.00
	තැපැල් ගාස්තු		1,328,322.97		891,524.76
	කුලී, වරිපනම් සහ බදු		7,316,886.85		6,701,835.26
	ආරක්ෂක සේවා ගාස්තු		36,180,587.36		40,347,468.00
	සේවක සුභසාධනය සහ වෙනත්		1,042,578.70		368,240.00
	දූරකථන ගාස්තු		21,883,045.90		17,466,794.56
	ප්‍රවාහනය		2,616,785.00		2,692,086.52
	ජලය		9,993,810.18		9,401,925.60
	උපදේශන සහ වෘත්තීය ගාස්තු		960,000.00		
			146,287,710.67		140,531,915.07

	මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්				
		සටහන	2016		2015
			රු.		රු.
21	රැකියාගත කිරීම්, පර්යේෂණ සහ ව්‍යවසායකත්වයන්				
	විෂය මාලා සංවර්ධනය		311,585.00		362,440.00
	සේවෝස්ථ සුහුණුව සහ අධීක්ෂණය		9,526,318.00		13,988,608.40
	ව්‍යවසායකත්ව වැඩසටහන්		1,000,748.25		936,144.80
	රැකියාගත කිරීම්		931,487.61		976,460.50
	පර්යේෂණ සහ අන්වේෂ අධ්‍යයන		376,228.00		122,600.00
	රාජ්‍ය සුද්ගලික සහභාගිත්වය		410,388.50		230,858.00
			12,556,755.36		16,617,111.70
22	වෙනත් මෙහෙයුම් වියදම්				
	වට්ටම් 10%		64,000.00		119,490.00
	පාඨමාලා සඳහා වට්ටම් වියදම් 50%		2,844,650.00		2,077,110.00
	විභාග සහ ඇගයීම්		6,190,224.46		4,560,505.13
	හොඳිලේ පාඨමාලා වියදම්		1,942,300.00		1,901,370.00
	ප්‍රසාද දීමනා		1,040,200.00		68,400.00
	අනුමත පාඨමාලා හැරයාම්		3,074,889.00		349,000.00
	නීති ගාස්තු		185,250.00		713,508.23
	විවිධ		5,826,632.65		4,153,020.47
	තත්ත්ව කළමනාකරණ ප්‍රතිඵලය		1,950,254.30		1,598,186.47
	වාර ප්‍රවේශ පත්‍ර		5,245,260.94		4,513,405.00
	විශේෂ සුහුණු වැඩසටහන්		757,565.50		1,109,740.00
	විශේෂ දීමනා		22,022,263.45		19,207,436.00
	ආවුද සහ පරිභෝජනයන්		2,431,255.30		2,986,791.84
	සිසුන්ගෙන් නොපියවුණු රක්ෂණ		298,500.00		305,700.00
	නොපියවූ පාඨමාලා ගාස්තු		54,000.00		2,962,935.00
			53,927,245.60		46,626,598.14

	මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
		සටහන	2016		2015
			රු.		රු.
23	විශේෂ ව්‍යාපෘති සඳහා වියදම්				
	යෙදවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - උසස් පෙළ සිසුන් සඳහා වැඩසටහන		130,725.00		2,170,119.25
	ආණ්ඩුක නිපුණතා සංවර්ධන අංශය		153,114,359.42		114,270,351.26
	GIZ සඳහා වියදම්		609,531.99		
	ILO සඳහා වියදම්		5,114,231.17		
	අයවැය අයෝජනා සඳහා වියදම්		23,608,531.18		
	WUSC ව්‍යාපෘතිය සඳහා වියදම්		865,256.00		
	අයෝවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය - ඵලදායක නිපුණතා දිනය				53,025.00
	ලංකා විදුලි බල මණ්ඩලය				1,776,368.50
			183,442,634.76		118,269,864.01
24	මූල්‍ය වියදම්				
	බැංකු අය කිරීම්		207,089.01		185,196.91
			207,089.01		185,196.91

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

25. පූර්ව වර්ෂයේ ගැලපීම්

විස්තර	ලැබීම්	ගෙවීම්	
පාරිතෝෂික ලබාදීම්	-	56,687,929.47	56,687,929.47
හැරයෑම්	505,445.00	-	-
මුළු එකතුව	505,445.00	56,687,929.47	-

පූර්ව වර්ෂයේ ගැලපීම් ලෙසට පහත සඳහන් වැඩි සහ අඩු ප්‍රතිපාදන ගලපා ඇත.

ඉහත ගැලැපිම්වල ප්‍රතිඵලයක් වශයෙන් 2015 වර්ෂයට අදාලව රු. 75,332,248.82 ක්වූ ඍණතාවය 2016 දී රු. 19,149,764.35 පහත බැස ඇත.

26. කැපකිරීම් හා අවිනිශ්චිත වියදම්

අධිකාරියට එරෙහිව නඩු පැවරීම

විසඳිය යුතුව තිබූ අධිකරණ නඩු පහත සඳහන් පරිදි විය.

අධිකරණය	31.12.2016	31.12.2015
ශ්‍රේෂ්ඨාධිකරණය	02	02
දිස්ත්‍රික් අධිකරණය	01	01
කම්කරු අධිකරණය	01	01
කම්කරු දෙපාර්තමේන්තු විමර්ෂණ	-	03
එකතුව	04	07

ඉ) මූලධන කැපකිරීම්

2016.12.31 දිනට සැලකිය යුතු මූලධන කැපකිරීම් කිසිවක් නොවිය.

27. දේපළ ,යන්ත්‍ර හා උපකරණයන්ගේ භාවිතයට ගත නොහැකි අයිතමයන්ගේ පිරිවැය ගැලපීම.

2013,2014,2015,2016 වර්ෂයේ පවත්වන ලද වත්කම් සමීක්ෂණයේදී වෙන්දේසියේ දමනු ලබන අයිතමන් හඳුනාගෙන ඇති අතර එම ඇතැම් අයිතමයන් 2014,2015,2016 වන විට වෙන්දේසි කර හෝ විනාශකර ඇත. එම අයිතමයන්ගේ පොතේ වටිනාකම 2017 වර්ෂයේ දේපළ ,යන්ත්‍ර හා උපකරණ (ස්ථාවර වත්කම්) ගිණුමට ගළපනු ඇත.

28. බොල් ණය ප්‍රතිපාදන

බොල්ණය ප්‍රතිපාදන රු.6,966,641.40 න් රු.6,775,037.37ක් ලැබිය යුත්තේ තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයෙන් සහ ලබාගන්නා ලද ආරක්ෂක සේවය වෙනුවෙන් වන අතර ඒ සම්බන්ධයෙන් යථාකාලයේදී තීරණයක් බලාපොරොත්තුවෙයි.

29. ගෙවිය යුතු TVEC ව්‍යාපෘති අරමුදල

2014 දෙසැම්බර් 31 දින වන විට TVEC ව්‍යාපෘතියේ ශේෂය වූ රු. 10,427,341.81 පාඨමාලා සඳහා ප්‍රදානය කරන ලදී. මේ වනවිට අදාළ පාඨමාලා උපකරණ දැනටමත් මිලදී ගෙන ඇති අතර එබැවින් එම උපකරණ 2017 වර්ෂයේදී හිලවී කරනු ඇත.

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය 2016.12.31.දිනට ශේෂ පිරික්සුම		
ක්ෂය වීම්	හර	බැර
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම		
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අත්පත් කර ගැනීම	1,758,758,726.44	
ගොඩනැගිලි සහ ගොඩනැගිලි සංවර්ධන අත්පත් කර ගැනීම.	3,331,745,320.70	
පරිගණක උපකරණ අත්පත් කර ගැනීම.	466,282,179.84	
විදුලි උපකරණ අත්පත් කර ගැනීම.	8,644,825.81	
ගෘහභාණ්ඩ සහ සවිකිරීම් අත්පත් කර ගැනීම.	272,736,558.18	
මෝටර් වාහන අත්පත් කර ගැනීම.	298,580,398.43	
කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම.	114,892,740.94	
දේපල සහ පිරියත අත්පත් කර ගැනීම.	91,906,195.27	
පුහුණු උපකරණ අත්පත් කර ගැනීම.	1,942,455,990.29	
ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		
ගොඩනැගිලි සහ වැඩි දියුණු කිරීම් සඳහා ක්ෂය වීම් ප්‍රතිපාදන		949,955,846.93
පරිගණක උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන		306,508,985.32
විදුලි උපකරණ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		5,538,666.03
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		119,285,117.97
මෝටර් වාහන ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		233,459,441.55
කාර්යාල උපකරණ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		45,371,079.38
දේපල සහ පිරියත ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		65,710,774.49
පුහුණු උපකරණ ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන		1,230,362,251.83
ඉටු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු		
කෙරෙමින් පවතින වැඩ - ගොඩනැගිලි ව්‍යුහයන්	90,229,551.49	
ආයෝජන		
සේවක ණය	25,000.00	
ඉන්වෙන්ටරි		
පුහුණු ද්‍රව්‍ය	21,916,262.21	
ලිපි ද්‍රව්‍ය	5,904,978.19	

වෙනත් පරිභෝජනයන්	749,033.57	
වෙනත් ලැබීම්		
වැඩසටහන් සඳහා අත්තිකාරම්	344,105.00	
තැන්පතු	559,750.00	
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය	3,930,931.24	
වාහන සේවා ආදායම් ලැබීම්	461,405.00	
පාඨමාලා ගාස්තු ලැබීම්	19,458,199.10	
වැටුප් ලැබීම්	679,882.55	
ආදායම් ඌණතාවයන්	11,732.00	
රාජ්‍ය සංවිධාන	3,035,710.16	
වෙළඳ හා වෙනත් ලැබීම්	11,266,498.70	
බොල් ණය සඳහා ප්‍රතිපාදන		6,966,641.40
සේවක ණය		
ආපදා ණය	44,411,431.41	
උත්සව අත්තිකාරම්	426,750.00	
මුදල් සහ මුදල් සමාන දෑ		
රන් කාසි	104,000.00	
බැංකු ගිණුම්		
අම්පාර	417,606.55	
අනුරාධපුරය	605,859.64	
බදුල්ල	101,445.48	
මඩකලපුව	2,375,161.71	
කොළඹ	982,446.72	
ගාල්ල	379,997.01	
ගම්පහ	69,033.71	
හම්බන්තොට	257,856.99	
ප්‍රධාන කාර්යාලය	136,699,802.35	
යාපනය	151,000.22	
කළුතර	829,841.81	
මහනුවර	219,413.26	

කැගල්ල	471,227.94	
කිලිනොච්චිය	862,136.98	
කුරුණෑගල	103,743.84	
මාතලේ	364,781.68	
මාතර	314,755.64	
මොණරාගල	1,163,209.60	
නුවරඑළිය	595,897.27	
ජා.වෘ.පු.ම - බද්දේගම	2,468,996.29	
ජා.වෘ.පු.ම - මිරිජ්ජවිල	696,704.88	
ජා.වෘ.පු.ම - නාරාහේන්පිට	704,149.90	
ජා.වෘ.පු.ම - නියාගම	397,098.80	
ජා.වෘ.පු.ම - ඔරුගොඩවත්ත	99,992.52	
ජා.වෘ.පු.ම - රත්මලාන	682,007.25	
ජා.වෘ.පු.ම - තලල්ල	657,032.06	
පොළොන්නරුව	1,932,979.22	
පුත්තලම	411,247.95	
රත්නපුරය	161,538.71	
ත්‍රිකුණාමලය	466,001.44	
වවුනියාව	2,215,450.83	
අතැති මුදල්	35,545.00	
අතැති චෙක්පත්	487,160.00	
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන		41,073,032.86
රජයේ පුනරාවර්තන ප්‍රදාන		1,286,473,000.00
කල් දැමූ ආදායම් ප්‍රතිපාදන - පුණරාවර්තන		397,269,169.33
වෙන් කිරීම් සහ අතිරික්තයන්		
කල් දැමූ ආදායම් ප්‍රතිපාදන		3,524,825,295.31
පාරිතෝෂිකයන් සඳහා ප්‍රතිපාදන		306,151,954.50
නැවත තක්සේරු කළ අධිභාරය		2,319,991,544.97
ගෙවීම්		
විගණන ගාස්තු ගෙවීම්		993,435.00
අයකැමි තැන්පතු		25,000.00
පාඩමාලා ගාස්තු ගෙවීම්		4,047,151.40
තැන්පතු		128,500.00
E'P'F ගෙවීම්		15,515,306.90

E'T'F.ගෙවීම්		2,327,296.34
දේශක ගාස්තු ගෙවීම්		3,091,600.00
වෙනත් ගෙවීම්		11,849,030.05
ව්‍යාපෘති අරමුදල් ගෙවීම්		21,028,772.00
අත්තිකාරම් ලැබීම්		798,200.00
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		2,049,356.51
රඳවා ගත් මුදල්		23,928,862.47
වැටුප් ගෙවීම්		287,607.05
කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම්		38,200.00
ශිෂ්‍ය රක්ෂණ ගෙවීම්		38,354,000.00
වෙළඳ ණයගැතියන්		3,691,563.32
ජංගම දුරකථන සඳහා වෙන් කිරීම්		1,818,537.09
W & O P ගෙවීම්		106,100.56
උපචිත වියදම්		
උපචිත වෘත්තිය මාර්ගෝපදේශනය		171,190.00
උපචිත විදුලි බලය		2,188,615.30
උපචිත විභාග සහ ඇගයීම්		677,400.00
උපචිත ඉන්ධන සහ ලිහිසි තෙල්		8,903.00
උපචිත සනීපාරක්ෂක සේවා		602,937.40
උපචිත නඩත්තු කිරීම්		2,017,703.72
උපචිත පුවත්පත් සහ වාර සංග්‍රහ		30,760.00
උපචිත සේවාස්ථ පුහුණුව		42,500.00
උපචිත අතිකාල, නිවාඩු දින වියදම්		1,052,956.89
උපචිත අර්ධකාලීන වියදම්		4,931,902.90
උපචිත ප්‍රවර්ධන වියදම්		3,236,096.57
උපචිත කුලී,වරිපනම් සහ බදු		334,468.17
උපචිත වාර ප්‍රවේශ පත්‍ර		781,266.90
උපචිත ආරක්ෂක සේවා		3,794,772.20
උපචිත වැටුප් දීමනා		1,869,300.00
උපචිත දුරකථන ගාස්තු		2,750,772.62
උපචිත ප්‍රවාහනය		65,900.00
උපචිත ගමනා ගමනය		524,881.95
උපචිත ජලය		263,779.65

වෙනත් ආදායම්		
වෙන්දේසි ආදායම්		2,147,364.50
පාඨමාලා ගාස්තු		131,818,200.00
ආපන ශාලා ආදායම්		235,900.00
සමාගම් ලියාපදිංචිය		54,000.00
දෛනික කටයුතු		3,225,000.00
ව්‍යවසායකත්ව වැඩසටහන		66,000.00
දඩ		61,956.00
ශාලා ආදායම්		2,005,430.00
නේවාසිකාගාර ගාස්තු		223,500.00
කතරගම සංචාරක බංගලාව		446,585.00
ණය වාරික		1,765,256.36
විවිධ ආදායම්		2,219,406.44
ආපසු නොගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		791,500.00
වාර්ථා පොත්		5,629,600.00
ලියාපදිංචි ගාස්තු		8,952,300.00
නිම කළ භාණ්ඩ වික්‍රිම		287,098.75
ඉතුරුම් ගිණුම් පොළිය		1,455,361.83
සැපයුම් ලියාපදිංචිය		519,400.00
ඉංග්‍රීසි පොත් ආදායම		607,200.00
නිෂ්පාදන ඒකකයේ ආදායම		
අධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය - අහුගම්මන		
ඉපැයුම 10%		594,733.25
අර්ධකාලීන පාඨමාලා		8,098,127.27
මුද්‍රණ පාසල නාරාහේන්පිට		1,655,574.82
පෙර ඉගෙනුම් ක්‍රමය		5,257,709.43
සිප්සල බොජුන් නාරාහේන්පිට		16,446.50
විවිධ ආදායම්		
ක්ෂේත්‍ර පරීක්ෂණ		16,500.00
තලල්ල රෙස්ටුරන්ට්		107,906.75
ටී - ෂර්ට් ආදායම		181,450.00
වාහන සේවා		108,360.05
අනෙකුත් නිෂ්පාදන ඒකක		617,859.98

විශේෂ ව්‍යාපෘතිවලින් ආධාර		
උසස් පෙළසිසුන්ගෙන් ආධාර		130,725.00
SSDP මගින් ආධාර		153,114,359.42
GIZ මගින් ආධාර		609,531.99
ILO මගින් ආධාර		5,114,231.17
අයවැය යෝජනා මගින් ආධාර		23,608,531.18
WUSC ව්‍යාපෘතිය මගින් ආදායම		865,256.00
කාර්යමණ්ඩල වියදම්		
E'P'F' වියදම්	132,994,370.57	
E'T'F' වියදම්	33,090,585.86	
වෙනත් දීමනා (කාර්ය මණ්ඩල වියදම)	404,872,812.05	
වැටුප් සහ අතිකාල	458,799,988.26	
කාර්ය මණ්ඩල පාර්තෝෂික		
පාරිතෝෂිකයන් සඳහා අධිභාරය		
ගමනාගමනය		
නවාතැන් වියදම්	653,293.00	
	7,370,473.58	
ගමනාගමනය - විදේශිය	3,040,313.57	
වියදම් වර්ගීකරණය	1,571,868.15	
සැපයුම් සහ වෙනත් පරිභෝජනයන්		
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය සඳහා අය කිරීම්	13,553,344.51	
වෙනත් සැපයුම්	2,017,800.99	
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	10,249,669.23	
මුද්‍රණ ද්‍රව්‍ය	5,379,687.00	
නඩත්තු		
ගොඩනැගිලි නඩත්තුව	10,426,012.39	
දේපල සහ පිරියත නඩත්තු කිරීම	9,515,292.54	
වාහන නඩත්තුව	14,205,900.13	
ගිවිසුම්ගත සේවා		
වෙළඳ දැන්වීම්	4,429,622.25	
විගණන ගාස්තු	500,000.00	

වන්දි		
විදුලි බල අය කිරීම්	47,614,556.80	
කුලි ගාස්තු	400,000.00	
රක්ෂණය	2,779,876.62	
සනීපාරක්ෂක සේවා	8,755,895.04	
පුවත්පත් සහ වාර සංග්‍රහ	485,743.00	
තැපැල් ගාස්තු	1,328,322.97	
කුලි, වරිපනම් සහ බදු	7,316,886.85	
ආරක්ෂණ සේවා	36,180,587.36	
කාර්ය මණ්ඩල සුභසාධනය සහ වෙනත්	1,042,578.70	
දුරකථන අය කිරීම්	21,883,045.90	
ප්‍රවාහනය	2,616,785.00	
ජල ගාස්තු	9,993,810.18	
උපදේශන හා වෘත්තිය ගාස්තු	960,000.00	
රැකියා ගත කිරීම,පර්යේෂණ සහ ව්‍යවසායකත්වය		
විෂය මාලා සංවර්ධනය	311,585.00	
සේවාස්ථ පුහුණුව සහ අධීක්ෂණය	9,526,318.00	
ව්‍යවසායකත්ව පුහුණුව	1,000,748.25	
රැකියා ගත කිරීම	931,487.61	
පර්යේෂණ සහ අන්වේෂ්‍ය අධ්‍යයන	376,228.00	
රාජ්‍ය පුද්ගලික සහභාගිත්වය	410,388.50	
වෙනත් මෙහෙයුම් වියදම්		
වට්ටම් 10%	64,000.00	
පුහුණුව සඳහා වට්ටම් වියදම් 50%	2,844,650.00	
විභාග සහ ඇගයීම	6,190,224.46	
නොමිලේ පාඨමාලා සඳහා අය කිරීම්	1,942,300.00	
ප්‍රසාද දීමනා	1,040,200.00	
අනුමත හැරයාම් - 2016 (පූර්ණකාලීන)	3,074,889.00	
නිති ගාස්තු	185,250.00	
විවිධ වියදම්	5,826,632.65	
ගුණාත්මක කළමනාකරණය සහ ප්‍රතිපාදනය	1,950,254.30	

වාර ප්‍රවේශ පත්‍ර	5,245,260.94	
විශේෂ පුහුණු වැඩසටහන්	757,565.50	
වැටුප් දීමනා	22,022,263.45	
ආවුද සහ පරිභෝජනයන්	2,431,255.30	
නොපියවන ලද රක්ෂණ	298,500.00	
නොමිලේ පාඨමාලා සඳහා රක්ෂණය	54,000.00	
විශේෂ ව්‍යාපෘති සඳහා වියදම		
උසස් පෙළ සිසුන් සඳහා වියදම	130,725.00	
SSDP සඳහා වියදම	153,114,359.42	
GIZ සඳහා වියදම	609,531.99	
ILO සඳහා වියදම	5,114,231.17	
අයවැය යෝජනා සඳහා වියදම	23,608,531.18	
WUSC ව්‍යාපෘතිය සඳහා වියදම	865,256.00	
මූල්‍ය වියදම		
බැංකු අයකිරීම්	207,089.01	
පුහුණු ද්‍රව්‍ය	92,250,834.64	
කාර්ය මණ්ඩල පුහුණුව - ධාරිතා සංවර්ධනය	4,276,341.81	
ප්‍රවර්ධන වියදම්	12,763,267.05	
වෘත්තිය මාර්ගෝපදේශනය	2,348,003.18	
ක්ෂයවීම්	397,269,169.33	
ලාභ /අලාභහානි ගිණුම්	752,188,530.98	
පෙර වසරේ ගැලපීම		56,182,484.47
	11,413,158,273.99	11,413,158,273.99

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පවවග/3/සිවිප/1/16/22 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජනවාරි 23 දින

ගරු සභාපති

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ප්‍රනිඥ අධිකාරිය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ප්‍රනිඥ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මූල්‍ය පනතේ 14(2)(ඇ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ප්‍රනිඥ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ඉදිරි වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 12 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ප්‍රනිඥ අධිකාරිය පනතේ 25 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ අනුකූලත් විධිවිධාන ප්‍රකාර මගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය පනතේ 14(2)(ඇ) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැන්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන කෙරෙහින්ධයෙන් කළමනාකාරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකයාගේ වගකීම

මාගේ විගණනය මත සඳහන්වට වෙනස් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. එම ප්‍රමිතිවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවශ්‍යන්ද යන්න සිදුබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම සිදිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අවශ්‍ය කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරීක්ෂා ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරීක්ෂාවන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථානෝචිතව උචිත විගණන පරිසරට සැලසුම් කිරීම් පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා ගණදෑ ගන්නා ලද ගිණුම්කරණ දැක්ෂතාවෙන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මූල්‍ය පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත ලබාදිමානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් උචිතාගත යැයි විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාවකාශනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාවකාශනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 සත්‍යාපනකිරීමේ කළ හිමිය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වෙන වශයෙන්, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වන්දිය සුහුඹු අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

පහත සඳහන් නිරීක්ෂණ කරුණු දැක්වේ.

(අ) ප්‍රමිතියේ 34 ඡේදය ප්‍රකාරව දේපල පිරියත සහ උපකරණ අයිතම සාධාරණ වටිනාකම් යටතේ සැලකිය යුතු තරම් වන සහ ඉන්පසුව වෙනස්වීම් වලින් ප්‍රයෝජන වන්නේ නම් ඒවා වර්ෂිකවද එසේ සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් පවතින්නේ නම් අයිතම වසර 3කට හෝ වසර 5කට වරක් ප්‍රතාපාගණනය කිරීම් ප්‍රමාණවත් බව දක්වා ඇත. එහෙත් 2016 දෙසැම්බර් 31 දිනට අයිතමය සතුව පැවති වටිනාකම රු. 5,763,014,972 ක් වූ වන්නම්වල සාධාරණ අගය ගිණුම්ගත කිරීම සඳහා 2008 වර්ෂයෙන් පසු ප්‍රතාපාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව ඉවත් කරන වන්නම්වල ඔපිවැය අඩංගු වන්නම් ගිණුම්වලින් ඉවත් කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වුවද, 2009 වර්ෂයෙන් පසු ඉවත් කරනා ලද වන්නම්වල වටිනාකම්, අදාළ වන්නම් ගිණුම්වලින් යන ස්ථාවර වන්නම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. ඒ අනුව 2015 හා 2016 වර්ෂවලදී එලෙස ඉවත් කරන ලද වන්නම්වල ඔපිවැය හා සම්පිඩිවී ඇති ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අවධානයට

පහත සඳහන් නිරීක්ෂණ කරුණු ලැබේ.

(අ) කාර්යමෙහෙවරට යටත් වන්නිය සුහුඹු ආයතනයෙහි ආරක්ෂණ භාණ්ඩය ඉදිකිරීමෙහි නොනිමුණුතුව යටතේ 2016 වර්ෂයට අදාළ වියතුව රු.1,097,195 ක් වූ වගවීම ප්‍රායෝගිකව ගෙවා නොතිබුණි.

(ආ) මෙරටට රට දෙනත් සඳහා සිදු කරන ලද ප්‍රාග්ධන ගිවිසුමෙහි අඩුත්වැඩියාව වෙනුවෙන් ගම්මලෙවීන වර්ෂයේ වැය කරන ලද රු. 929,427 ක වියදම ප්‍රාග්ධනීය කර නොතිබුණි.

(ඇ) නීතුණතා සංවර්ධන දායකත්වයට අදාළ නවීකරණ වියදම් රු. 2,085,873 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ඉතුරු වර්ෂයේ වියදම් 05 කට අදාළව අවලංගු කරන ලද වෙක්පත් 75 ක වටිනාකම් වූ රු.173,635 ක් සමුච්චිත අරමුදලට ගැලපීම් වෙනුවට සම්බන්ධිත වර්ෂයට අදාළ වියදම් වලින් අඩුකර දක්වා නිබුණි.

(ඉ) පොදුජනයා ධුරකරුවන් සම්බන්ධයෙන් වෙත ධුරකරුවන් ගෙවූ ගෙවීම්වලදී 2014, 2015 හා 2016 වර්ෂයන් වෙතුවෙන් ලබා දී නිබූ රු. 1,818,537 ක වටිනම් ආදායම් ලෙස ගිණුම්ගත නොකර ගෙවීම පසුවේ රංගති වගකීම් යටතේ ගෙවිය යුතු ගෙවීමක් ලෙස දක්වා නිබුණි.

(ඊ) සම්බන්ධිත වර්ෂය තුළ අධිකාරිය විසින් සුහුඹු මධ්‍යස්ථාන පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත් 06 ක් වෙතුවෙන් ගෙවා නිබූ රු. 29,581,369 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, අත්තිකාරම් ලෙස ගිණුම්ගත නොකර කෙරිගෙන යන වැඩ ගිණුම්ගත කිරීමේ අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර නිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 39,748,214 ක් වූ ලැබිය යුතු ශේෂ තුළ ඇතුළත් 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු පාඨමාලා ගාස්තු රු. 19,458,199 ක් වූ අතර එයින් රු. 2,204,788 ක් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. ඉතිරි රු. 17,253,411 කින් රු .10,277,809 ක් 2017 දෙසැම්බර් 10 වන විටත් අයනොවී පැවතුණි.

(ආ) වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙන් වර්ෂ 16 ක සහ වර්ෂ 11 ක සිට අයකර ගත යුතු පිළිවෙලින් රු. 3,930,931 ක් හා රු. 131,043 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වෙනත් රජයේ ආයතන 11 කින් වර්ෂ 11 කට වැඩි කාලයක සිට අයකර ගත යුතු රු. 2,844,106 ක ශේෂය තුළ දැනට වසා දමා ඇති ලක්සල ආයතනයෙන් අයකරගත යුතුව පවතින රු. 1,437,200 ක ශේෂයක් නිරීක්ෂණය විය. කෙසේ වුවද දීර්ඝ කාලයක සිට අයවීමට ඇති මෙවැනි ශේෂ සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු පියවරක් නොගෙන වර්ෂයෙන් වර්ෂයට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ශේෂවල එකතුව රු. 130,578,519 ක් වූ අතර ඉන් රු. 10,080,342 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට ද, රු. 4,854,746 ක් වර්ෂ 03 සිට වර්ෂ 05 දක්වා කාලයක් සහ රු. 35,963,225 ක් වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාලයක සිටද ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර එම ශේෂ පියවීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

නීති රීති සහ රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) VIII වැනි පරිච්ඡේදයේ 4.1 ඡේදය	අධිකාරිය විසින් තෘතීයීය මට්ටමේ සිටින මාණ්ඩලික නිලධාරීන් 21 දෙනෙකුට රු. 885,361 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.
(ii) IX පරිච්ඡේදයේ 2.2 ඡේදය	සමාලෝචිත වර්ෂයේදී රු. 10,930,695 ක අර්ධකාලීන පුහුණු උපදේශක ගාස්තු ගෙවා තිබූ අතර ඒ සඳහා අයකර ගත යුතු සියයට 10 රාජ්‍ය භාගය රු. 1,093,069 ක් වුවත් අධිකාරිය විසින් වර්ෂය තුළ රු. 594,733 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඒ අනුව රු. 498,336 ක රාජ්‍ය භාගය අයකර නොතිබූ අතර සියලු අර්ධකාලීන පාඨමාලා උපදේශක ගාස්තු මත රාජ්‍ය භාගය අය කරන බවට තහවුරු කරගෙන නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 104	රත්මලාන ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක දෘඩාංග පාඨමාලාවට අයත් පරිගණක යන්ත්‍ර 02 ක් 2015 ජනවාරි 15 දින අස්ථානගතව තිබූ අතර සිදුවූ පාඩු හා හානි පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

(ii)	මුදල් රෙගුලාසි 110	ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි
(iii)	මුදල් රෙගුලාසි 188 (2)	2009 වර්ෂයේදී බැංකුවේ තැන්පත් කරන ලද රු. 49,644 ක් වූ චෙක්පත් 2 ක් 2016 දෙසැම්බර් 31 වනවිටත් උපලබ්ධි වී නොතිබිය දී ඒ පිළිබඳ පසුවිපරම් සිදුකර නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 571	වර්ෂ 2 වැඩි කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් 30 දෙනෙකුට ගෙවිය යුතු රු. 4,980,200 ක රඳවා ගැනීම් මුදල් හා රු. 584,996 ක ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.3.1 (vii) ඡේදය	යම් හේතුවක් මත වැඩ බැලීමේ පත්වීම් සිදු කළද එය මාස 03 ක් ඉක්මවා ලබා නොදිය යුතු වුවත්, ඊට පටහැනිව වර්ෂ 03 දක්වා වැඩ බැලීමේ පත්වීම් මත රාජකාරී ආවරණ කළ අවස්ථා 03 ක් නිරීක්ෂණය විය.

(ඉ)	2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	චක්‍රලේඛයට පටහැනි ලෙස අධිකාරියේ සේවයේ නියුතු සේවකයන්ගේ පෞද්ගලික දුරකථන බිල්පත් සේවකයන්ගේ වැටුපෙන් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත පාලක මණ්ඩල අනුමැතිය අනුව අධිකාරිය විසින් මාසිකව රු. 353,853 ක සාමාන්‍ය මුදලක් දුරකථන වෙනුවෙන් වැය කර දින 12 කට පසුව වැටුපෙන් ප්‍රතිපූර්ණ කර ගෙන තිබුණි.

2.5. ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

රක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා 2014 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ආධුනිකයන්ගෙන් රු. 500 බැගින් එකතු කර රු.38,354,000 ක් අධිකාරියේ බැංකු ගිණුමක තැන්පත්කර වර්ෂය තුළ ඉන් රු.500,000 ක් පමණ වන්දි ලෙස ගෙවා තිබුණද 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එස්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය පරිදි අරමුදලක් පිහිටුවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 33,280,068 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 75,332,249 ක් වුයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 108,612,317 ක වර්ධනයක් ඇති වී තිබුණි. පුනරාවර්තන වැය සඳහා වූ භාණ්ඩාගාර ප්‍රදාන රු. 124,473,000 කින් හා වෙනත් ආදායම් රු. 16,898,073 කින් වැඩිවීම සහ ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ වියදම් රු. 5,763,323 කින් හා රැකියාගත කිරීම්, පර්යේෂණ හා ව්‍යවසායකත්ව වියදම් රු. 4,060,356 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

ප්‍රවර්තන වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මුල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 හා 2016 වර්ෂවල මුල්‍ය අතිරික්තයන්ද ඉතිරි වර්ෂවල ඌනතාවයන්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු ආයතනයේ දායකත්වය 2012 සිට 2016 වර්ෂය දක්වා පිළිවෙලින් රු. 1,144,087,661 ක්, රු. 1,023,595,450 ක්, රු. 1,059,237,421 ක්, රු. 1,338,404,900 ක් හා රු. 1,460,306,994 ක් විය. ඒ අනුව 2013 වර්ෂයේ සිට ආයතනයේ දායකත්වය අඛණ්ඩව වැඩිවීමක් පෙන්නුම් කරයි.

3.2 විග්‍රහාත්මක මුල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයට අදාල පාඨමාලා ගාස්තු ආදායම රු. 131,818,200 ක් ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ආදායම් ගණනය කිරීමේදී නිශ්චිතව හඳුනාගත හැකිව තිබූ පාඨමාලා ගාස්තු නිදහස් කිරීම හා අනුමත ආධුනික හැරයාම් එකතුව රු. 7,861,839 ක් ආදායම් ලෙස හඳුනාගෙන පසුව වෙනත් මෙහෙයුම් වියදම් ලෙස ලියාහැර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත අනුව, වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම සේවා නියුක්තිය සඳහා පුහුණුවක් ලබා දීම, ජාතික ශිල්පීය පරීක්ෂණ හා විභාග පැවැත්වීම හා සහතිකපත් නිකුත් කිරීම, වෘත්තීය පුහුණු පිළිබඳ පර්යේෂණ පැවැත්වීම හා සංවර්ධනය කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම, පහසු කිරීම හා ඒවාට සහාය වීම, මාර්ගෝපදේශනය හා උපදේශනය, රැකියාගත කිරීම, ශ්‍රම වෙළඳපල ඉල්ලුම හා සැපයුම පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව සඳහා අවශ්‍ය ජාතික හා ජාත්‍යන්තර පුහුණු සංවිධාන හා ආයතන සමඟ සබඳතා පවත්වාගෙන යාම සහ වෘත්තීය පුහුණුව සඳහා අවශ්‍ය පුද්ගලයන් පුහුණු කිරීම, සම්බන්ධීකරණය හා පහසු කිරීම යන කාර්යයන් ආයතනයේ ප්‍රධාන අරමුණු විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் நாயகம் அதிபர் திணைக்களம்
Auditor General's Department
AGDSL

අධිකාරිය විසින් වර්ෂ කිහිපයක සිට ශ්‍රම වෙළඳපල ඉල්ලුම හා සැපයුම පිළිබඳ පර්යේෂණ පවත්වා නොතිබුණු අතර ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාම සඳහා ද අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම පරීක්ෂාවෙදී පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී විවිධ ක්ෂේත්‍ර 18 කට අයත් වූ පුහුණු පාඨමාලා 133 ක පුහුණු වැඩසටහන් 2,584 ක් සඳහා ආධුනිකයන් 35,460 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබූ අතර ඒ යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් 1,952 ක් සඳහා ආධුනිකයන් 31,537 දෙනෙකු එනම් ඉලක්ක කළ ප්‍රමාණයෙන් සියයට 88 ක් බඳවාගෙන තිබුණි. එයින් අර්ධ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් 4,700 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද ආධුනිකයින් 1,833 ක් පමණක් බඳවාගෙන තිබුණි. ඒ අනුව අර්ධකාලීන පාඨමාලා සඳහා බඳවාගැනීම් ඉලක්කයෙන් සියයට 39 ක් පමණක් ඉටුකර තිබුණි.

(ii) මූලික වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයක් නොවන තොරතුරු තාක්ෂණ සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම කෙරෙහි සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් වැඩි අවධානයක් යොමුකර තිබූ අතර මූලික වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර අනුව ආධුනික බඳවා ගැනීම් කෙරෙහි අඩු අවධානයක් යොමු කර තිබුණි.

(iii) තොරතුරු තාක්ෂණ, සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණ (IT Sector) ක්ෂේත්‍රයට 2016 වර්ෂය සඳහා බඳවාගැනීම් වලින් සියයට 23 ක් එනම් 7439 ක් වූ වැඩිම බඳවා ගැනීම් කර තිබූ නමුත් වැඩිම රැකියාගත කිරීම් වූ 978 ක් විදුලි විද්‍යුත් හා විදුලි සංදේශ ක්ෂේත්‍රය සඳහා සිදුකර තිබුණි. ඒ අනුව රැකියා වෙළඳපොළ ඉලක්ක කර පුහුණු කටයුතු සැලසුම් කර නොමැති බව නිරීක්ෂණය විය.

(iv) 2016 වර්ෂය තුළ රැකියාගත කිරීම් අංශයේ ඉලක්කගත රැකියාගත කිරීම් ප්‍රමාණය 8,300 ක් වී තිබූ අතර සත්‍ය රැකියාගත කිරීම් 6,052 ක් එනම් සියයට 63 ක් වී තිබුණි.

(v) විදේශීය රැකියාගත කිරීම් ඉලක්කය සියයට 41 ක් වුවද සත්‍ය රැකියාගත කිරීම් සියයට 03 ක් පමණක් වී තිබීම නිසා විදේශීය රැකියා වෙළඳපොළ කෙරෙහි නැඹුරුනාවය අඩු බව නිරීක්ෂණය විය.

(vi) අධිකාරියෙන් පුහුණුව ලබා වාර්ෂිකව ඉවත්වන පුහුණුලාභීන් රැකියාගතවීම පිළිබඳ පසුවිපරමක් ආයතනය විසින් සිදු කර නොතිබුණු අතර ඒ පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වා ගෙන නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිලධාරීන් 8 දෙනෙකුගෙන් අයකරන ලද රු. 106,100 ක මුදල වැන්දඹු හා අනත්දරු අරමුදලට ප්‍රේෂණය නොකර ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු අරමුදල් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් පුහුණු කටයුතු සඳහා මිලදී ගෙන ස්ථාවර වත්කම් ලේඛනයේ පුහුණු උපකරණ ලෙස දක්වා තිබූ මෝටර් රථ 19 ක් අධිකාරියේ ධාවන කටයුතු සඳහා භාවිතා කර තිබුණි. තවද අධිකාරිය විසින් භාවිතා කරන ලද ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති මෝටර් රථ 22 ක් පුහුණු කටයුතු සඳහා ලබාදී තිබූ අතර පුහුණු කටයුතු සඳහා ලබා දීමට පෙර එම වාහනවල ලියාපදිංචි අංක මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හරහා අවලංගු කරවාගෙන නොතිබුණි.

(ආ) නීකුණාමල දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරීක්ෂාවේදී හඳුනාගත් අඩුපාඩු පහත දැක්වේ.

(i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව ජාතික වෘත්තීය මට්ටම් සහතික (NVQ) ලබා දෙන සියළු පාඨමාලාවල, පාඨමාලා ප්‍රතිනව කටයුතු (accreditation) වසර 03 කට වරක් සිදුකළ යුතු වුවත් නීකුණාමල

දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල පවත්වාගෙන යන පාඨමාලා 03 ක ප්‍රතිනවය කළ යුතු කාලපරිච්ඡේදය මාස 06 ක් ඉක්මවා තිබුණද අවශ්‍ය ප්‍රතිනවය 2017 දෙසැම්බර් 12 දින වන විටත් කර නොතිබුණි.

(ii) පුල්මුඩේ ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ කාර්මික ශිල්පී පාඨමාලාව (වසර 1 ක) 2016 අගෝස්තු 08 දින ආරම්භකර තිබුණද ඒ සඳහා අවශ්‍ය පුහුණු ද්‍රව්‍ය විගණිත දිනය වූ 2017 පෙබරවාරි 01 දින වන විටත් ලබා දී නොතිබුණි.

(iii) නීකුණාමල දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ හා ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලා පහසුකම් පරීක්ෂාවේදී විදුලි පහසුකම්, ප්‍රමාණවත් පුටු සංඛ්‍යාවක් සහ ප්‍රමාණවත් පරිගණක සපයා නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(iv) නියැදි පරීක්ෂාවකදී හෙලිදරව් කරගත් පරිදි නීකුණාමල දිස්ත්‍රික්කයේ පුහුණු මධ්‍යස්ථාන 03 ක පාඨමාලා හදාරන දමිළ මාධ්‍ය ආධුනිකයන්ට 2017 ප්‍රථම අර්ධ වර්ෂය සඳහා දෛනික පුහුණු වාර්තා පොත් 2017 පෙබරවාරි 01 දින වන විටත් ලබාදී නොතිබුණු අතර මධ්‍යස්ථාන 02 ක විදුලි කාර්මික ශිල්පී පාඨමාලාව හදාරන දමිළ ආධුනිකයන් හට සිංහල දෛනික පොත් සහ ඡායා පිටපත් කළ දමිළ මාධ්‍ය පොත් ලබා දී තිබුණි.

(v) අග්බෝපුර ග්‍රාමීය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු තාක්ෂණ පාඨමාලාවට අයත් යූපීඑස් (UPS) 12 ක් අක්‍රිය වී තිබූ නිසා පරිගණක වල පැවැත්ම අනාරක්ෂිත වී තිබුණි.

(ඇ) ආපනශාලා පවත්වාගෙන යාම සඳහා වාර්ෂිකව ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම මගින් කොන්ත්‍රාත්කරුවන් තෝරාගත යුතු වුවද 2011 වසරේ සිට 2017 සැප්තැම්බර් 30 දක්වාම නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ආපනශාලාව පවත්වාගෙන යාම ප්‍රසම්පාදන විධිවිධාන වලට පටහැනිව එකම පුද්ගලයෙකු වෙත ලබා දී තිබුණි.

4.4 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

ලෝක කම්කරු සංවිධානය මගින් වව්නියාව, මන්නාරම, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක වල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නගා සිටුවීම සඳහා 2016 වර්ෂය තුළ ලබා දී තිබූ රු. 20,271,540 ක මුදලින් 2016 දෙසැම්බර් 31 දිනට රු. 1,355,755 ක් අයිකාරියේ නිලධාරීන් 31 දෙනෙකු අතර දීමනා ලෙස බෙදා දී තිබුණද ගෙවීමේ අවිධිමත්භාවය නිසා එය නැවත අයකර ගැනීමට සභාපතිවරයා විසින් තීරණය කර තිබුණි. 2017 ඔක්තෝබර් 31 දින වන විට ඉන් රු. 272,489 ක් තවදුරටත් අයකර ගත යුතුව පැවතුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු. 1,500,000 ක් වූ සහ 2016 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 150,169 ක් වූ බස්රථය වර්ෂ දෙකකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රයේද, පිරිවැය රු. 1,100,000 ක් වූ සහ 2016 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 110,124 ක් වූ තවත් බස්රථයක් වර්ෂයකට වැඩි කාලයක සිට භාවිතයට නොගෙන අම්පාර නින්දවූර් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයේද ගාල්කර තිබුණි.

(ආ) නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි වටිනාකම හඳුනා ගැනීමට නොහැකි වූ අම්පාර හා ගාල්ල දිස්ත්‍රික්කයන්හි පාඨමාලා 12 කට අයත් පුහුණු උපකරණ අයිතම 1,849 ක් එම පාඨමාලා නොපවැත්වීම හේතුවෙන් නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) 2017 පෙබරවාරි 02 දින කරන ලද නියැදි පරීක්ෂාවකදී සේරුවාවිල ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථානයේ කෘෂිකාර්මික උපකරණ කාර්මික ජලනල කාර්මික පාඨමාලාවන්ට අයත් පුහුණු උපකරණ හා වෙරුගල් පුහුණු මධ්‍යස්ථානයේ වැද්දුම් ශිල්පීය පාඨමාලාවට අදාල උපකරණ උපදේශකවරුන් නොමැතිව පාඨමාලා නොපැවැත්වීම හේතුවෙන් නිශ්කාර්යව තිබුණි. 2017 ජූලි 31 දින වන විටත් එම පාඨමාලා ආරම්භ කිරීමට කිසිදු සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2015 හා 2016 යන වර්ෂ තුළ කුච්චවේලි සහ කරෙයිනගර් හෝටල් පාසල් සඳහා මිලදී ගෙන තිබූ රු. 10,481,619 ක් වටිනා පුහුණු උපකරණ එම මධ්‍යස්ථානවල ඉදිකිරීම් අවසන් කර නොතිබීම හේතුවෙන් 2017 ජූලි 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. සමහර පුහුණු උපකරණවල වගකීම් කාලය උපකරණ භාවිතයකින් තොරව අවසන්වී තිබූ අතර ඇතැම් උපකරණ මල බැඳීම, අවපැහැ ගැන්වීම් වලට ලක්ව තිබිණි.

(ඉ) (i) ආදර්ශ හෝටලයක් ලෙස පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ ඇගයීමකින් තොරව හෝටල් පුහුණු ක්ෂේත්‍රයට අදාල පාඨමාලා 04 ක් පවත්වාගෙන යන ලද ගාල්ල දිස්ත්‍රික්කයේ අහංගම පිහිටුවා තිබූ හෝටල් පාසල පිහිනුම් තටාකයක් සහිතව තරු 03 නේ මට්ටමේ හෝටලයක් ලෙස නවීකරණය කිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය මත 2014 ඔක්තෝබර් 06 වන දින රු .110,355,000 ක වටිනාකමට දින 240 ක කාලයකින් නිම කිරීමට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි.

(ii) තවද තරු තුනේ මට්ටමේ එම හෝටලයේ සුඛෝපභෝගී පහසුකම් සහිත හෝටලයක් ලෙස තව දුරටත් වෙනස්කම් සිදුකිරීමට 2016 අප්‍රේල් 29 දින රු. 12,362,223 ක් වූ අමතර ඇස්තමේන්තුවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. 2017 ජුනි 30 දින වන විට මෙම ඉදිකිරීම් සඳහා රු. 1,011,801,679 ක් වැයකර තිබූ නමුත් වරින් වර සැලසුම් වෙනස්කිරීම් හා කොන්ත්‍රාත් කරුගේ අඩුපාඩු නිසා 2017 ජුනි 30 දක්වා ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. කෙසේ වුවද තරු තුනේ මට්ටමේ හෝටලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් අධිකාරිය සතුව නොමැති නිසා එය රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට පෞද්ගලික අංශයේ ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා 2017 මාර්තු 22 දින පුවත්පත් නිවේදනයක් මඟින් ලංසු කැඳවා තිබුණි.

(iii)ප්‍රමුඛතාවය ලබා දිය යුතු ඉදිකිරීම් පිළිබඳව නිවැරදිව හඳුනා නොගෙන අහංගම හෝටල් පාසල ආදර්ශ හෝටලයක් ලෙස නවීකරණය කිරීම හේතුවෙන් අදාල හොටල් පාසල වෙනත් ඉඩමක ඉදිකිරීම 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. හොටල් පාසලේ ඉදිකිරීම් ප්‍රමාද වීම නිසා 2014 වර්ෂයේදී නවතා දමන ලද පාඨමාලා හතර 2017 වර්ෂය වන විටත් නැවත ආරම්භ කිරීමට නොහැකි වීමෙන්

එම හෝටල් පාසලේ ප්‍රයෝජනය සඳහා 2015 හා 2016 වර්ෂවල මිලදී ගෙන තිබූ රු. 8,605,519 ක් වටිනා පුහුණු උපකරණ පුරා වසර දෙකකටත් වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි. අරමුදල් සපයා දී තිබූ ව්‍යාපෘතියේ හා අධිකාරියේ අරමුණු ඉටු වී නොතිබුණි.

4.6 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවීමකින් තොරව බැංකු ජංගම ගිණුම් 05 ක එකතුව රු. 331,133 ක මුදලක් රඳවා ගෙන තිබුණි.

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතින් 2011 වර්ෂයේ දී පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා ලබාදුන් රු. 9,815,342 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු නොකර ගෙවිය යුතු ව්‍යාපෘති අරමුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි.

4.7 ආර්ථික නොවූ ගනුදෙනු

2016 වර්ෂය තුළ පුහුණු උපකරණ මිලදී ගැනීම පිළිබඳ සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවකදී තාක්ෂණික ඇගයීම් කමිටු විසින් අවස්ථා 10 කදී අවම මිල ලංසු ඉදිරිපත් කල ප්‍රසම්පාදන පිළිනොගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ හේතූන් පිළිගත නොහැකි වූ අතර ඒ සඳහා වූ වැඩි මිල ලංසු පිළිගැනීම නිසා එම මිලදී ගැනීම් වෙනුවෙන් රු. 3,220,900 ක් වැඩිපුර ගෙවීමට අධිකාරියට සිදු වී තිබුණි.

4.8 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් අධිකාරියේ සම්පත්

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වෙත අධිකාරියේ නිලධාරීන් තුන්දෙනෙක් හා ඊට අයත් වාහන දෙකක් ලබා දී තිබූ අතර ඊට අමතරව නිපුණතා ආංශික ව්‍යාපෘතිය වෙත එක් නිලධාරියෙක් නිදහස් කර තිබුණි. ඒ වෙනුවෙන් අධිකාරිය වර්ෂය තුළ වැටුප් හා දීමනා ලෙස රු. 1,477,596 ක වියදමක් දරා තිබුණි.

4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අධ්‍යක්ෂ (මුදල්) තනතුර 2015 අප්‍රේල් 30 දින සිට පුරප්පාඩුව පැවති අතර 2015 මැයි 05 දින සිට මෙම තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක පත්කර තිබීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වය කෙරෙහි විගණනයේදී ගැටළුකාරී විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත ස්ථීර කාර්ය මණ්ඩලය 2,361 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1,814 ක් වූයෙන් පුරප්පාඩු 547 ක් වී තිබුණි. පුරප්පාඩු තනතුරු වලින් 269 ක් උපදේශකවරුන් වීම නිසා ඉලක්ක කරන ලද පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ඇ) අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව කොන්ත්‍රාත් පදනමින් උපදේශකවරුන් බඳවා ගැනීමට ප්‍රතිපාදන සලසා නොතිබියදී සුදුසුකම් සම්පූර්ණ නොකළ උපදේශකවරුන් දිගින් දිගටම කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන පසුව කොන්ත්‍රාත් කාලය පරිවාස කාලය ලෙස සලකා සුදුසුකම් නොමැතිව තනතුරෙහි ස්ථීර කර තිබුණි. එලෙස කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන වර්ෂ 03 කට වැඩි සේවා කාලයක් සහිත උපදේශක නිලධාරීන් 80 දෙනෙකු 2017 ජනවාරි මාසයේදී උපදේශකවරුන් ලෙස ස්ථීර කර තිබුණි.

(ඈ) අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ 5.1.1 වගන්තිය අනුව උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමේදී ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමක් යටතට අයත් නාක්ෂණ විද්‍යා පාඨමාලාවක් හදාරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතු වුවත් 2014 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම් මත බඳවාගත් උපදේශකවරුන් පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවේදී බඳවා ගත් උපදේශකවරු 91 දෙනාගෙන් 23 දෙනෙකුම එම සුදුසුකම් සපුරා නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) තනතුර සඳහා බඳවා ගැනීමේදී බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5.2.6 වගන්තිය ප්‍රකාරව නියමිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් නියම කර ඇති ලකුණු දීමේ ක්‍රමවේදයට අනුව සිදුකළ යුතු

චුවද එයට පටහැනිව 2015 ජුනි 05 දිනැති අධිකාරියේ සභාපතිවරයාගේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 08 දෙනෙකුගේ අත්සන් සහිත ලිපියකට අනුව එම තනතුර සඳහා 2015 අප්‍රේල් 22 දින සිට අවිධිමත්ව නිලධාරියෙකු පත්කර තිබුණි.

(ඊ) ආයතනයේ මාධ්‍ය පුහුණු පාඨමාලාවක් ක්‍රියාත්මක කර නොතිබියදී 2011 වර්ෂයේදී එම ක්ෂේත්‍රය සඳහා මූලික සුදුසුකම් සම්පූර්ණ නොකළ උපදේශකවරියක කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණද ඇය උපදේශකවරයකුගේ කාර්යභාරය ඉටුකර නොතිබියදී දිගින් දිගටම ඇයට සේවා දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. පසුව අධිකාරියෙන්ම ලබා ගන්නා ලද පුහුණුව මත 2014 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ උපදේශකවරියක ලෙස නැවත කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණි. නිලධාරිනිය එම ක්ෂේත්‍රයේද කාර්යභාරයන් විධිමත්ව ඉටුකර නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

(උ) 2013 දෙසැම්බර් මස 17 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යමණ්ඩල තොරතුරු අනුව එක් එක් නිලධාරියාට පෞද්ගලික වනසේ ඇතිකරන ලද (MA 1-2) වැටුප් පරිමාණය යටතේ මූලික සුදුසුකම් නොමැතිව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් උපදේශකවරුන් ස්ථිර කරමින් කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-2) සේවා ගණය තවදුරටත් පවත්වාගෙන ගොස් තිබුණි.

4.10 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාරාහේන්පිට ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මායිම් තාප්පය ඉදිකිරීම සඳහා වටිනාකම රු. 1,781,424 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමක් 2016 ජූලි 29 වන දින ඇති කර ගෙන තිබූ අතර ගිවිසුම් හා ඉදිකිරීම් ප්‍රමාණ පත්‍රය අනුව භූමිය සකස් කිරීම සඳහා පස් කියුබ් 14 ක් පිරවීම වෙනුවට ABC කියුබ් 16.16 ක් පිරවීම, තාක්ෂණික ඇගයීම් කමිටුව 2016 දෙසැම්බර් 26 දින නිර්දේශ කර තිබුණි. ඉදිකිරීම් අධීක්ෂණය කරන ලද කාර්මික නිලධාරී විසින් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර තිබූ රු. 1,280,146 ක අවසන් බිල්පත්‍රය සහතික කර තිබුණද එම ගෙවීම් අත්හිටුවා ආයතනය විසින් ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයෙන් භූමිය සකස් කිරීම පිළිබඳ ලබාගත් වාර්තාව අනුව ABC යෙදීම වෙනුවට

ගඩොල් හා ගල් කැට යොදා භූමිය සකස්කර තිබුණ බව නහවුර කරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) **(i)** ත්‍රිකුණාමලය කුච්චවේලි හෝටල් පාසල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව දින 365 කින් අවසන් කිරීම සඳහා 2014 දෙසැම්බර් 23 වන දින කොන්ත්‍රාත් වටිනාකම රු. 169,164,622 ක ගිවිසුමට එළඹ තිබුණි. එහෙත් 2017 පෙබරවාරි 03 වන දිනට ඒ සඳහා දින 772 ක් ගතවී තිබුණද එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

(ii) විගණන දිනය වූ 2017 සැප්තැම්බර් 29 දින වන විටත් එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය අධිකාරිය විසින් පවරාගෙන නොතිබුණි. තවද උක්ත ගොඩනැගිල්ල ඉදිකිරීමේදී දිස්ත්‍රික් මිනින්දෝරු විසින් සලකුණු කළ ඉඩමෙන් පිටත පිහිටි ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයට අයත් භූමියක කොටසක්ද ඇතුළත් වන පරිදි ඉදිකිරීම් සිදුකර ගෙන යන බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) ඉඩමේ මූලික පස් හා භූගත ජල පරීක්ෂාවක් සිදුකර මොරටුව විශ්ව විද්‍යාලයේ හිටපු මහාචාර්යවරයෙකු විසින් පිහිටි පොළව මත මීටරයක් උසට පස් පුරවා ඉදිකිරීම් කිරීමට ලබාදී තිබූ උපදෙස් පදනම් කරගෙන පස් ඝන මීටර් 11,500 ක් යොදා භූමිය පිරවීම සඳහා ඝන මීටරයකට රු. 1,100 බැගින් රු. 12,650,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ හෝ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය නොමැතිව ඉදිකිරීම් භූමියේ පස් පිරවීම වෙනුවට මූල පාෂාණය ඉවත් කර ඝණ මීටර් 636.34 ක ගල් කැඩීම සිදුකර තිබුණ බව 2017 පෙබරවාරි 17 දින සිදුකළ විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. ඒ වෙනුවෙන් රු.7,884,253 ක් කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවා තිබුණි.

(v) පහත් බිමක ඉදිකිරීම් සිදු කිරීම නිසා පහසුවෙන් ගං වතුර ආපදාවන්ට ලක්විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) (i) මිරිජ්ජවිල ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට වැඩහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා දින 150 කින් නිම කිරීමට පෞද්ගලික සමාගමක් සමඟ රු. 42,613,557 ක වටිනාකමට 2013 ඔක්තෝබර් 07 දින, කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබූ අතර කල් දිගු කිරීම් 02 සහිතව 2014 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කළ යුතුව තිබුණි. නමුත්

එදිනට වැඩ අවසන් කර නොනිබීම මත අධිකාරිය විසින් 2015 ජනවාරි 05 දින සිට ඉදිකිරීම් කාර්යය අත්හිටුවා තිබූ අතර එම තීරණයට එකඟ නොවූ කොන්ත්‍රාත්කාර සමාගම සමථකරණ මණ්ඩලයක් වෙත මෙම සිද්ධිය යොමු කර තිබුණි. 2017 ජූනි 30 දක්වා මෙම ආරවුල අවසන් කර නොතිබුණි.

(ii) කෙසේ වුවද ඉදිකිරීම් කාර්යය අත්හිටුවීමෙන් පසු අධිකාරිය විසින් පත්කරන ලද උපදේශන ආයතනයක උපදෙස් පරිදි අධිකාරිය විසින් 2015 ඔක්තෝබර් 25 දින සකස් කර තිබූ වාර්තාව අනුව, රු.21,765,110 ක් වූ කල වැඩ වටිනාකමින් (වැට් සහිත) රු16,957,562 ක් වූ බිල්පත් ගෙවීම් හා වැඩ පුර්ව අත්තිකාරම්ද ගිවිසුම අනුව ඉතිරි වැඩ සඳහා සියයට 25 ක අධිභාර රු. 6,022,991 ක් ,ප්‍රමාද ගාස්තු හා අනෙකුත් අයකිරීම් රු. 2,603,557 ක් ඇතුළුව එකතුව රු25,584,110.ක අඩුකිරීම් කල පසු කොන්ත්‍රාත් සමාගමෙන් රු. 3,819,000 ක මුදලක් ආපසු අයකර ගත යුතුව තිබුණි.

(iii) ඉදිකිරීම් කාර්යය නිම කිරීම සඳහා 2016 අප්‍රේල් 08 දින නැවත ලංසු කැඳවා තිබුණද ඉදිකිරීම් කළ මුල් කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹ නොනිබීම හේතුවෙන් දෙවන වරට කැඳවූ ලංසු කැඳවීමේ ඇගයීම් කටයුතු 2016 ඔක්තෝබර් 27 දින පැවැත්වූ ප්‍රසම්පාදන කමිටුව විසින් අත්හිටුවීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද 2016 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් වැඩ වසර දෙකකට වැඩි කාලයක සිට ප්‍රමාද වී තිබුණි.

5 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ 2016 වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම

2014 – 2018 වර්ෂය සඳහා අධිකාරිය විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැළැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්මට අනුව අධිකාරිය විසින් වර්ෂය තුළ වැඩසටහන් 99 ක් සඳහා ආධුනිකයින් 1,285 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මකවී නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් සැලසුම් කර නොතිබූ වැඩසටහන් 12 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඒ සඳහා ආධුනිකයින් 294 ක් බඳවාගෙන තිබුණි.

5.4 අභ්‍යන්තර විගණනය

2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක සීඑම්ඒ/2009(i) හා මුදල් රෙගුලාසි 133 හි සඳහන් පරිදි, අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නිළධාරීන් 12 දෙනෙකු අනුයුක්ත කර තිබුණද විගණන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කටයුතු හා 2012 – 2016 සංයුක්ත සැලැස්මෙහි සඳහන් අරමුණු හා ඉලක්කයන් සපුරා ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් අවධානය යොමුකර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

මාගේ පසුගිය වාර්තාවෙන් පෙන්වා දෙන ලද පහත ඌනතාවයන් සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(අ) 2003 වර්ෂයේදී අනතුරට ලක්වූ කැබ රථයක් සම්බන්ධයෙන් රීට වර්ෂ 06 කට පසුව 2009 පෙබරවාරි මාසයේදී පත්කරන ලද පරීක්ෂණ කමිටු නිර්දේශයට අනුව අනතුරෙන් වූ රු. 421,000 ක් වූ අලාභය අයකර ගැනීමට 2017 ඔක්තෝබර් 30 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් තම නිත්‍ය තනතුරට අමතරව 2006 ජනවාරි 17 දින සිට 2014 වර්ෂය දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලන මණ්ඩලයේ සාමාජික හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් එම අරමුදලින් රු. 5,444,015 ක් ලබා ගෙන තිබීම සම්බන්ධයෙන් 2014 සැප්තැම්බර් 12 දින පැවති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිළිබඳ පොදු ව්‍යාපාර කාරක සභා අවස්ථාවේදී ජනාධිපති ලේකම් විමසා උපදෙස් ලබා ගන්නා ලෙස ලේකම්වරයාට නියෝග කර තිබූ නමුත් ඒ සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) අධිකාරියේ බදවා ගැනීමේ පරිපාටියට පටහැනිව සුදුසුකම් හෝ පලපුරුද්ද සම්පූර්ණ කර නොතිබුණු අධ්‍යක්ෂ ජනරාල්, තනතුරද ඇතුළු විධායක මට්ටමේ තනතුරු 06 ක් සඳහා බදවා ගැනීම් සිදුකර තිබුණි. ඊට අමතරව අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් නොවූ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා ද නිලධාරියකු බදවාගෙන තිබුණි. එම පත්කිරීම් සම්බන්ධව හිටපු විනිසුරුවරයකු මගින් 2015 වර්ෂයේදී විමර්ශනයක් කර නිකුත් කරන ලද වාර්තාවෙන් කරන ලද නිර්දේශයන් 2017 දෙසැම්බර් 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) 2011 වර්ෂයේදී ලෝක සංචාරක දිනය සැමරීම් වෙනුවෙන් සැලසිනේ ආයතනයට ගෙවීම් සඳහා 2012 පෙබරවාරි මාසයේ දී රු. 7,500,000 ක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන ආයතනයෙන් ලැබී තිබුණි. අදාළ ගෙවීම් කිරීමෙන් අනතුරුව ඉන් ඉතිරි වූ රු. 1,000,000 ක් පාලක මණ්ඩල අනුමැතියකින් තොරව 2015 වර්ෂයේ දී අධිකාරියේ ආදායමට ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මූල්‍ය අක්‍රමිකතා මත වැඩ තහනම් කර නඩු පවරා තිබූ නිලධාරියෙකුට අනුමැතියකින් තොරව 2008 වර්ෂයේදී වැටුප් වශයෙන් රු. 1,711,961 ක් ගෙවා තිබූ අතර මෙසේ නොසැලකිලිමත්ව ගෙවීම් සිදුකිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය වන තෙක්ම ගෙන නොතිබුණි.

(ඊ) 2012 වර්ෂයේදී මිලදී ගත් ස්ථාවර වත්කම් වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු. 1,875,747 ක මුදල ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩුකම් හේතු කරගෙන ඇතිව තිබූ මතභේදාත්මක තත්ත්වය මත වර්ෂය තුලදීද නිරවුල් කර නොතිබුණි.

5.6 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 78 සිට සියයට 1,363 දක්වා විචලතාවන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	කාර්ය මණ්ඩල පරිපාලනය	- බදවා ගැනීමේ අවම සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් බදවා ගෙන තිබීම. - සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩල විධිමත්ව ක්‍රියාත්මක නොවීම. - විධිමත් ස්ථානමාරු ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම
(ආ)	වත්කම් පාලනය	- විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකිරීම. - වත්කම් හඳුනා ගැනීමේ කේත භාවිතා නොකිරීම - නිෂ්කාර්ය වත්කම් පැවතීම - සියළු වත්කම් ඉන්වෙන්ට්‍රිගතව පැවතීම තහවුරු නොවීම හා වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම. - අපහරණය කරන ලද වත්කම්, වත්කම් ලේඛන වලින් ඉවත් කර නොතිබීම.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் நாயகம் அதிபதி திணைக்களம்
AGDSL Auditor General's Department

(ඇ) මෙහෙයුම් පාලනය
- ආධුනික දීමනාව ලැබුණු බවට ආධුනිකයාගෙන් තහවුරුවක් ලබා නොගැනීම
- දීමනාව ගණනය කිරීමේ ක්‍රමවේදයේ වෙනස්කම් තිබීම.
- පාඨමාලා ගාස්තු බැංකුගත නොකර, උපදේශකවරුන්ට මුදලින් ලබා ගැනීමට අවසර ලබා තිබීම.
- සියළු අර්ධකාලීන පාඨමාලා සඳහා රාජ්‍ය භාගය අයකරන බව තහවුරු කරගෙන නොතිබීම.
- රාජ්‍ය භාගය වෙනම ආදායමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබීම.

(ඉ) මූල්‍ය පාලනය
- අභ්‍යන්තර පාලනයන් ඇති වන පරිදි කාර්යභාරයන් නිලධාරීන් අතර කාර්යභාරයන් බෙදා දී නොතිබීම.
- අධීක්ෂණ කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) සී වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාවට අදාළව නිරීක්ෂණ වාර්තාව

2.2.1. (අ) 2018.03.31 දින වන විට අධිකාරිය සතු සියළු ස්ථාවර වත්කම් වල විස්තර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නිම කිරීමට කටයුතු කර ඇති අතර මේ වන විට 90% කට වැඩි ප්‍රමාණයක් ලේඛනයට ඇතුළත් කර ඇත.

2.2.1. (ආ) 2018 වර්ෂය අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කරනු ඇත.

2.2.2 (අ) අදාල පරීක්ෂණ කරමින් පවතින අතර එය අවසන් වූ වහාම වටිනාකම් නිශ්චිතව හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කරනු ඇත.

2.2.2 (ආ) 2017 ගිණුම් වල ගැලපීම් සිදුකර ඇත.

2.2.2 (ඇ) SSDP ව්‍යාපෘතිය මුදල් පදනමින් (Cash Basic) ගිණුම් පවත්වා ගෙන යනු ලබන බැවින් SSDP ව්‍යාපෘතිය මඟින් ප්‍රතිපූර්ණය කරනු ලබන වියදම් අධිකාරිය විසින් උපචිත වියදම් ලෙස වෙන්කිරීම් කරනු නොලබයි.

2.2.2 (ඈ) මේ වන විට සියළු ගැලපීම් සිදු කර ඇත.

2.2.2 (ඉ) අදාළ ගැලපීම් සිදු කර ඇති බැවින් ඉදිරියට ශේෂයක් පිළිඹිඹු නොවේ.

2.2.2 (ඊ) 2017 වර්ෂයේ නිවැරදි කර ඇත. ඉදිරි වර්ෂවල මෙවැනි අවස්ථාවලදී මේ අනුව ක්‍රියා කිරීමට කටයුතු කර ඇත.

2.3 (අ) නිරවුල් වී ඇත.

2.3 (ආ) රු. ලක්ෂ 5ට වැඩි වටිනාකම් ඉවත් කිරීම සඳහා මෙතෙක් භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොමැත. ලක්ෂ 5ට අඩු වටිනාකම් මේ වන විට පොත්වලින් ඉවත් කර ඇත.

2.3 (ඇ) රු. ලක්ෂ 5ට වැඩි වටිනාකම් ඉවත් කිරීම සඳහා මෙතෙක් භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොමැත. ලක්ෂ 5ට අඩු වටිනාකම් මේ වන විට පොත්වලින් ඉවත් කර ඇත.

2.3 (ඈ) විවිධ ව්‍යාපෘති අරමුදල් තුළ ඇති TVEC ආයතනයට අදාළ රු මිලියන 9.8 ක් නිරවුල් කිරීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනිමින් පවති.

2.4 (අ) (i) අධිකාරියේ තෘතික මට්ටමේ නිළධාරීන්හට අතිකාල ගෙවීම් සිදු කරනු ලැබුවේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිවය.(ඇමුණුම 01)
ඉන්පසු 2016.04.25 දිනැති 2016/02 කළමනාකරණ සේවා චක්‍රලේඛනය අනුව තෘතික මට්ටමේ නිළධාරීන්හට අතිකාල ගෙවීම් නවත්වා ඇත.

2.4 (අ) (ii) අදාළ උපදෙස් ක්‍රියාත්මක වෙමින් පවති.

2.4 (ආ) (i) මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂණයක් සිදු කොට පරිගණක යන්ත්‍ර වල වටිනාකම අදාළ නිළධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.

2.4 (ආ)(ii) අදාළ උපදෙස් ක්‍රියාත්මක වෙමින් පවති.

2.4 (ආ) (iii) තොරතුරු ලබා ගැනීමට කටයුතු කරමින් පවති.

2.4 (ආ) (iv) ඉල්ලුම් කිරීම් අනුව ගෙවීමට කටයුතු කරනු ලැබේ.

2.4 (ඇ) පිළියෙළ කරමින් පවති.

2.4 (ඈ)

පී.රාමදාස් මහතා (මුල්‍ය නිළධාරී) - මුලතිව් දිස්ත්‍රික්කයේ මුල්‍ය නිළධාරී ලෙස පත් කරන ලැබුවේ මුලතිව් දිස්ත්‍රික්කය සඳහා අලුතින් පත් කරන ලද මුල්‍ය නිළධාරී වැඩ භාර නොගත් නිසාය. මුලතිව් වැනි දුෂ්කර දිස්ත්‍රික්කයකට සේවය කිරීම සඳහා නිළධාරීන් නොපැමිණීම මෙම වැඩ බැලීම සඳහා පත් කිරීමට හේතු විය.

H.M.L.A.සමරනායක මහතා - මෙම තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා දී ඇත්තේ අභ්‍යන්තර පුරප්පාඩු පිරවීමක් වශයෙනි. මෙම තනතුරේ මූලික අවම සුදුසුකම වන මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ NVQ 05 ජාතික සුදුසුකම ලබා තිබීමයි. එහෙත් දැනට ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් අභ්‍යන්තරව නොසිටින බැවින් මෙම පුරප්පාඩුව පිරවීමට නොහැකි විය. කෙසේ වෙතත් 2018 නැවත වතාවක් අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමට කටයුතු කර ඇත.
H.U.කාරියවසම් මහතා[අධ්‍යක්ෂ(මුදල්)-2018 වසරේ මෙම තනතුර පිරවීම සඳහා කටයුතුකර ඇත.

2.4 (ඉ) මොබිටෙල් ආයතනයේ ජංගම දුරකථන බිල්පත් ලැබෙනුයේ යම්කිසි මසක 25 දින සිට ඊළඟ මාසයේ 24 වන දින දක්වාය. නිළධාරීන්ගෙන් දුරකථන බිල්පත් අයකර ගත හැකි වන්නේ බිල්පත් ලැබුණු මාසයට පසු මාසයේ වැටුපෙනි. එම නිසා සෑම මසකම බිල්පත ඊළඟ මස වැටුපෙන් ක්‍රමානුකූලව අයකර ගැනීම සිදු කරනු ඇත.

2.5 එකඟවෙමි.
මෙම අරමුදල සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇතත් මෙතෙක් මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලැබී නොමැත. මහා භාණ්ඩාගාරයෙන් මේ සම්බන්ධව විමසා සිටිමේදී ඔවුන් නැවත අදාල ලිපි ලේඛන විස්තර සහිතව ඉදිරිපත් කරන ලෙස දැන් වූ අතර නැවත වරක් ලිඛිතව අදාළ ලිපි ඉදිරිපත් කරන ලදී. ඒ අනුව අදාළ අනුමැතිය ඉදිරියේදී ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

3.1 එකඟවෙමි.

3.2 පාඨමාලා ගාස්තු අය කිරීම දැනසිදු නොවන බැවින් ඉදිරියට අදාළ නොවේ.

4.1 (අ) ශ්‍රම වෙළඳපල ඉල්ලුම හා සැපයුම පිළිබඳව පර්යේෂණයන් 2016 වර්ෂයේදිදිස්ත්‍රික්ක 11 කත් 2017 වර්ෂයේදී ඉතිරිදිස්ත්‍රික්ක 14 කද සිදුකර අවසන් කර ඇත. එමෙන්ම පහත සඳහන් ජාත්‍යන්තර ආයතන සමඟ ද අප ආයතනය වෘත්තිය පුහුණුවේ සංවර්ධනය සඳහා සබඳතා පවත්වාගෙන යමින් ජාත්‍යන්තරයට ගැලපෙන අයුරින් පාඨමාලා සංවර්ධනය කර පවත්වාගෙන යනු ලැබේ. (GIZ ,WUSC ,JAICA , KOIKA , ILO, MICROSOFT , HMTI (HINDUSTAN MOTER TECHNOLOGY INSTITUTE)

4.1 (ආ) (i) මේ වන විට මෙම පාඨමාලාවන් පවත්වාගෙන යනු ලබන අතර මීට අමතරව ආධුනික ආකර්ශනය අවම ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි ආධුනික ආධුනිකාවන් හට එම ක්ෂේත්‍රයෙහි පුහුණුව ලබා දීම පිණිස බස්නාහිර පළාත පළමුව ඉලක්ක කර දින 120 ක පුහුණු නියමු ව්‍යාපෘතියක් මේ වන විට ආරම්භ කර ඇත.

4.1 (ආ) (ii) මේ වන විට බස්නාහිර පළාත් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දින120 නියමු ව්‍යාපෘතිය මගින් පහත සඳහන් දිස්ත්‍රික්කයන්හි ආධුනික ආධුනිකාවන් පුහුණුව ලබයි.

01. කළුතර දිස්ත්‍රික්කය
   (i) ඉංගිරිය - (පෙදරේරු)
   (ii) බුලත්සිංහල - (පෙදරේරු)
02. කොළඹ දිස්ත්‍රික්කය
   (i) හෝමගම - (ලී වැඩ)
03. ගම්පහ දිස්ත්‍රික්කය
   (i) සමනබැද්ද - (ලී වැඩ)
   (ii) නැදුම්ගොල්ල - (පෙදරේරු)
   (iii) නැදුම්ගොල්ල - (ජලනල)

බස්නාහිර පළාත් නියමු ව්‍යාපෘතියෙහි ආධුනික පුහුණු කටයුතු නිම වීමෙන් පසු අනිකුත් දිස්ත්‍රික්කයන් සඳහා ද මෙම ඉදිකිරීම් ක්ෂේත්‍ර පුහුණු විශේෂ වැඩසටහන ව්‍යාප්ත කිරීමට යෝජිතය.

4.1 (ආ) (iii) පිළිතුර අංක (ii) පරිදි වේ.

4.1 (ආ) (iv) 2016 වසර තුල රැකියාගත කිරීම් 6052 ක් වූ අතර 2017 වසර තුල රැකියා 6661 දක්වා වර්ධනය වී ඇත.

4.1 (ආ) (v) විදේශ නියුක්ති කාර්යංශය හා එක්ව වැඩසටහන් කරගැනීමට ක්‍රියාමාර්ග ගත්තද වැඩි වශයෙන් රැකියා බහුලව ඇත්තේ මැද පෙරදිග රටවල් වල බැවින් එකී රටවල් වලින් ගෙවනු ලබන වැටුප් ප්‍රමාණවත් නොවන නිසා ආධුනියන් ඒ සඳහා යැමට මැලි කමක් දක්වයි. කෙසේ නමුත් ඉදිරියේ දී එකී ක්‍රියාමාර්ග ගනිමින් විදේශ රැකියා වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ඇත.

4.1 (ආ) (vi) 2016 2017 වසර වල රැකියාගත වුවන්ගේ සියලු තොරතුරු රැකියාගත කිරීමේ අංශය සතුව ඇත. මීට අමතරව එම තොරතුරු කළමණාකරන පද්ධතියට (MI) එම තොරතුරු ඇතුලත් කර ඇත.
2017 මෙය 2018 වසරේ සිට විධිමත්ව සිදු කරමින් පවති

4.2 මෙතෙක් තොරතුරු ලැබී නොමැත.

4.3 (අ) අධිකාරියේ පවත්නා දැඩි වාහන ඌනතාවය නිසා රාජකාරී අවශ්‍යතාවය මත අවස්ථානුකූලව පුහුණු උපකරණ සඳහා යොදා ගත් වාහන 19 ක් (මොටර් සයිකල් සහ ත්‍රිවිල්) පුහුණු කටයුතු වලට බාධා නොවන පරිදි අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගෙන ඇත. එසේම එම ලබා ගත් වාහන වෙනුවට අධිකාරියේ ප්‍රවාහන කටයුතු සඳහා භාවිතා කරන ලද වාහන 22 ක් පුහුණු කටයුතු සඳහා නිදහස් කොට ඇත. පුහුණු කටයුතු සඳහා ලබා දුන් වාහන 22 හි ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා මොටර් රථ කෙමසාරිස් වෙත යවා ඇත. එසේම ඉහත දැක්වූ පුහුණු කටයුතු ලබා ගත් වාහන 19 හි ස්ථාවර වත්කම් ලේඛනයේ වාහන ශීර්ෂයට මාරු කරන ලදී.

4.3 (ආ) (i) මේ වන විට තෘතියික හා වෘත්තිය කොමිෂන් සභාව මගින් පාඨමාලා ප්‍රතිතන විගණනය සිදු කර ප්‍රතිතන නිර්දේශ ලබා දී ඇත.

4.3 (ආ) (ii) පුල්මුඩේ විදුලි කාර්මික ශිල්පී පාඨමාලාවෙහි 2018 පළමු අධ්‍යන වාරය සඳහා ආධුනික ආධුනිකාවන් 20 දෙනෙකු බඳවාගෙන පුහුණු කටයුතු සිදු කරනු ලබයි.

4.3 (ආ) (iii) පුල්මුඩේ විදුලි කාර්මික ශිල්පී පාඨමාලාවෙහි 2018 පළමු අධ්‍යන වාරය සඳහා ආධුනික ආධුනිකාවන් 20 දෙනෙකු බඳවාගෙන පුහුණු කටයුතු සිදු කරනු ලබයි.

4.3 (ආ) (iv) දමිළ මාධ්‍ය **CBT** පොත් ලබා දීමේ ප්‍රමාදයන් නිසා මෙම තත්ත්වයන් ඇති වූ අතර මේ වන විට දමිළ මාධ්‍ය **CBT** පොත් ලබා දී ඇත.

4.3 (ආ) (v) ශ්‍රී අග්බෝපුර තොරතුරු තාක්ෂණ පාඨමාලාවෙහි 2018 පළමු අධ්‍යයන වර්ෂයෙහි පුහුණුව ලබන ආධුනික සංඛ්‍යාව 21 කි.
ශ්‍රී අග්බෝපුර මධ්‍යස්ථානයෙහි ලි වැඩ ශිල්පී (ගෘහ භාණ්ඩ) පාඨමාලාවෙහි 2018 පළමු අධ්‍යයන වර්ෂයෙහි පුහුණුව ලබන ආධුනික සංඛ්‍යාව 10 කි.

4.3 (ඇ) මෙම ගැටළුව නිවැරදි කරීමට පියවර ගෙන ඇත. පුවත්පත් දැන්වීම් පළ කර තරඟකාරී මිල ගණන් යටතේ ලංසු කැඳවා ඇති අතර , මේ වන විට මිල ගණන් ඇගයීමට ලක් කර තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) නිර්දේශයන් සමඟ කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමේ තීරණය ගැනීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයට යොමු කර ඇත. ප්‍රසම්පාදන කමිටුවට යොමු කල නමුත් වර්තමානයේ ආපනශාලාව පවත්වාගෙන යනු ලබන හිමිකරු විසින් ඔහුට අසාධාරණයක් සිදු වූ බව සඳහන් කරමින් උපසභාපතිතුමා වෙත යොමු කරන ලද ලිපියට සභාපතිතුමා විසින් ඉදිරි පියවර ගැනීම සඳහා යොමු කොට තිබූ අතර ඒ අනුව නැවත තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමු කිරීමට සභාපතිතුමාගෙන් අනුමැතිය ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇත.

4.4 නිරවුල් වෙමින් පවති.

4.5 (අ) සමස්ථයක් ලෙස බර වාහන රියදුරු පුහුණු උපදේශක පත් කිරීම සඳහා බර වාහන රියදුරු පුහුණු බලපත්‍රයක් සහිත උපදේශකවරුන් අවශ්‍යතාවයක් පවති. නමුත් එම සුදුසුකම සහිත උපදේශකවරුන්ගේ භිගයක් පවතින බැවින් එම පාඨමාලා ආරම්භ කිරීමේ දැඩි අපහසුතාවයක් පවති. ඉදිරියේදී මෙම බස්රථ දෙක වලදායි ලෙස යොදා ගැනීමට කටයුතු කරමින් පවති.

4.5 (ආ) මෝටර් වාහන පනතේ සංශෝදනයට පෙර සෘජුවම බර වාහන රියදුරු බලපත්‍ර අයදුම් කල හැකි අවධියේ මෙම බස් රථ ආධුනික රියදුරු පුහුණු කටයුතු සඳහා යොදවා තිබුණි.එම පනතේ සංශෝදනනේ පසුව බර වාහන රියදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා පළමුවර අයදුම්පත් ඉදිරිපත් කළ නොහැකි වූ නිසාවෙන් බර වාහන රියදුරු පුහුණු ආධුනිකයන් පුහුණුව සඳහා ලියාපදිංචි නොවූ අතර බර වාහන රියදුරු පුහුණු උපදේශකවරුන්ද සේවයට බඳවා ගැනීම දුශ්කර විය.
එම තත්වයන් මත අදාල බස් රථ යහපත් කාර්මික හා ධාවන තත්වයෙන් පවත්වා ගැනීම පිණිස පුහුණු මධ්‍යස්ථානයේ සිට ආසන්නතම නගරය දක්වා ශ්‍රී ල ග ම බස්ගාස්තුව පමණක් අය කර ආධුණික ආධුණිකාවන් හට ප්‍රවාහන පහසුකම් සැපයීමට එවකට කළමණාකාරීත්වය විසින් තීරණය කරන ලදී.

4.5 (ඈ) සේරුනුවර මධ්‍යස්ථානය - කෘෂි යන්ත්‍ර පාඨමාලාව
- ජලනල ශිල්පී පාඨමාලාව
ක්ෂේත්‍රය සඳහා සුදුසුකම්ලාභී දමිල මාධ්‍ය සහ සිංහල මාධ්‍යය උපදේශකවරුන් බඳවා ගැනීම පිණිස මුද්‍රිත මාධ්‍ය මඟින් ප්‍රසිද්ධ කලද අයදුම්පත් ඉදිරිපත් නොවූ බැවින් මෙම තත්වය පැන නැගී ඇත. උපදේශකවරුන් අනුයුකුත කල පසු පාඨමාලා පුහුණු කටයුතු ආරම්භ කිරීම හැකියාව පවති.

4.5 (ඈ) දැනට කුච්චවේලි හා කරයිනගර් යන වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන 2ම ඉදිකිරීම් හා නවීකරණ කටයුතු අවසාන කරඇති අතර, මේ වන විට පාඨමාලා ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පවති.

4.5 (ඉ) (i) අභංගම හෝටල් පාසැල නවීකරණ ව්‍යාපෘතිය මේ වන විට නිමකර ඇත.මෙහි මුළුතැන්ගෙයි නවීකරණ කටයුතු වලට අදාල ව්‍යාපෘතිය මේ වන විට අවසාන අදියරේ පවති.

4.5 (ඉ) (ii) දැනට මෙම ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික අංශය සම්බන්ධ කර ගැනීමට පුවත්පත් නිවේදනයක් නිකුත් කළ නමුත් ඊට තරඟකාරී ලෙස ලංසු ඉදිරිපත් නොවීම නිසා දැනට එම ක්‍රියාවලිය අත්හිටුවා ඇත.

4.5 (ඉ) (iii) 2018 වසරේ මෙම ව්‍යාපෘතිය නිම කර පුහුණුව ආරම්භ කිරීමට නියමිතය

4.6 (අ) ඉඳිරියට අවශ්‍ය වන බැංකු ගිණුම් 4 ක් හැර අනෙක් බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කර ඇත.

4.6 (ආ) පාඨමාලා ප්‍රතිනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලට ගැනීමට මෙම අරමුදල ලැබී ඇති අතර මේ වන විට පාඨමාලා විශාල ප්‍රමාණයක් ප්‍රතිනය කර ඇත. ඒ අනුව මෙම අරමුදල් භාණ්ඩාගාර ප්‍රතිපාදන අරමුදලට මාරු කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත

4.7 පුහුණු උපකරණ මිලදී ගැනීමේදී ලංසු ආරධනාවේ සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ නොකිරීම, වගකීම් කාලය, කල් පැවැත්ම , භාවිතා කර ලබා ඇති පළපුරුද්ද යනාදී කරුණු සැළකිල්ලට ගැනීමේදී අවම මිල ඉඳිරිපත් කර ඇති ආයතන වලින් භාණ්ඩ මිලදී ගැනීම සිදු කිරීමේදී තාත්ෂණ ඇගයීම් කමිටුව විසින් ආධුනික පුහුණුවීම් සඳහා භාවිතා කිරීමට සුදුසු දීර්ඝ කාලීන භාවිතයට ගත හැකි අයිතමයන් මිලදී ගැනීමට නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. එබැවින් සමහර අවස්ථාවන්හිදී අවම මිල සහිත භාණ්ඩ මිලදී ගැනීමක් සිදු නොවන අතර වඩාත් සුදුසු දීර්ඝ කාලීන භාවිතයට ගත හැකි පුහුණු උපකරණ මිලදී ගැනීමට නිර්දේශ ලබා දෙනු ලැබේ.

4.8 තාවකාලිකව ලබා දී ඇති මෙම සංචිත වාහන ලබා දීම පිළිබඳව අමාත්‍යාංශ ලේකම් වෙත ලිපියක් නිකුත් කර ඇත.

4.9 (අ) මේ වන විට ඉදිරි කටයුතු කරමින් පවති.

4.9 (ආ) ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අදාළ ගොඩනාගිලි ඉදිකිරීම් අවසන් වූ පසු අදාළ පාඨමාලා ආරම්භ කිරීමේ දී මෙම උපදේශකවරුන් බඳවා ගැනීමට නියමිතව ඇත.

4.9 (ඇ) මෙම අධිකාරියේ බඳවා ගැනීම් පටිපාටිය 2014.03.18 දින අනුමත කර ඇත. එම බඳවා ගැනීම් පටිපාටියට අනුව උපදේශක තනතුර කළමනාකාර සහකාර තාක්ෂණ (M1-2) සේවා ගණය යටතේ අනුමතකර ඇති අතර, බඳවා ගැනීමේ සුදුසුකම ජාතික වෘත්තිය සුදුසුකම් 05 වන මට්ටම ලබා දී ඇත. බඳවා ගැනීම් පටිපාටිය අනුමත කරන ලද දිනට පෙර එවකට පැවති සුදුසුකම් යටතේ බඳවා ගත් උපදේශක තනතුරේ සිටි නිලධාරීන් ඔවුන්ට පුද්ගලික වන සේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන (M1-2) සේවා ගණයේ ස්ථිර කාර්ය මණ්ඩලය යටතේ අනුමතකර ඇත. එබැවින් ඒ යටතේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සිටි උපදේශකවරුන් එවකට බඳවාගත් සුදුසුකම් මත වසර 03 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ස්ථිර කිරීමට කටයුතු කර ඇත

4.9 (ඈ) මෙරට තුළ ප්‍රථම වරට ජාතික වෘත්තිය සුදුසුකම් රාමුව (NVQ) 2007 වර්ෂයේදී ආරම්භ කරන ලදී. එම ක්‍රමය යටතේ ජාතික වෘත්තිය සුදුසුකම් 05 වන මට්ටම 2012 වර්ෂයේ සිට සීමිත පාඨමාලා කිහිපයක් සඳහා ක්‍රියාත්මක කර ඇත. ඉන්පසු වර්ෂවල වෘත්තිය පුහුණු අධිකාරියේ උපදේශක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පළකර බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට අයදුම්පත් කැඳවීම් සිදු කරන ලදී. එහෙත් රැකියා වෙළඳ පොළ තුළින් ජාතික වෘත්තිය සුදුසුකම් 05 වන මට්ටම සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හේතුවෙන් එම උපදේශක පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට නොහැකිවීමේ දුෂ්කරතාවයකට මුහුණු දීමට සිදුවී ඇත. එබැවින්, පාඨමාලා පවත්වා ගෙන යාමේ සේවා අවශ්‍යතාවය මත ජාතික වෘත්තිය සුදුසුකම් 04 වන මට්ටම හෝ ඊට සමාන සුදුසුකම් සහිත වසරක සේවා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

4.9 (ඉ) අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) තනතුර සඳහා 2015.02.22 දින සිට පුරප්පාඩුවී පැවති අතර ඒ සඳහා ඒ වන විට නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස වසර 10 ක සේවා පළපුරුද්දක් තිබූ අභ්‍යන්තර වශයෙන් එම තනතුරට සුදුසුකම් ලබා තිබූ ඩබ්.ඒ. රණවීර මහතා වැඩ බැලීම සඳහා පත්කරන ලදී. ඉන්පසු ඔහුගේ කාර්යක්ෂමතාවය හා පෙර අධිකාරිය තුළ දරණ ලද පහත සඳහන් තනතුරු සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඩබ්.ඒ. රණවීර මහතාගේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) තනතුර ස්ථීර කරන ලදී.

ඩබ්.ඒ. රණවීර මහතා විසින් පෙර දරණ ලද තනතුරු

තනතුර	සේවා කාලය
අධ්‍යක්ෂ (වෘත්තිය මාර්ගෝපදේශන හා රැකියා ස්ථාපන) වැ.බ.	2006.10.02 - 2008.02.25.
අධ්‍යක්ෂ ජනරාල් (වැ.ආ)	2008.02.25 - 2008.04.15.
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)	2008.04.15 - 2010.12.10.
අධ්‍යක්ෂ (වෘත්තිය මාර්ගෝපදේශන හා රැකියා ස්ථාපන) වැ.බ.	2012.11.05 - 2014.06.17.
අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)	2015.04.24 දින සිට මේ දක්වා

මෙම පත්කිරීම වෘත්තිය පුහුණු අධිකාරී පනතේ 16.(1) වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇති බලතල අනුව පත්කර ඇත.

4.9 (ඊ) මෙම නිළධාරිනිය බඳවාගෙන ඇත්තේ 2011 ජූනි 09 දින මාධ්‍ය උපදේශිකාවක් වශයෙනි. ඇයට පැවරී තිබූ රාජකාරිය වන්නේ ඉගැන්වීම් කටයුතු නොව මාධ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරමින් වෘත්තිය පුහුණු අධිකාරිය පිළිබඳව මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබා ගැනීමය. එම රාජකාරිය මෙම නිළධාරිනිය සාර්ථකව ඉටුකර ඇත. වෘත්තිය පුහුණු අධිකාරියේ උපදේශකවරුන්ට තමන්ගේ විෂය ක්ෂේත්‍රය මාරු කිරීමට අවස්ථාවක් ලබාදෙන අතර ඒ තුළින් මෙම උපදේශකත්ව පරිගණක ක්ෂේත්‍රය දක්වා විෂය ක්ෂේත්‍රය මාරු කරගෙන ඇත.

ඒ සඳහා මෙම උපදේශිකාව **NVQ** 03 සහතිකයක් **RPL** යටතේ ලබාගෙන ඇත. ක්ෂේත්‍රය මාරු කර ගත් පසු මෙම උපදේශිකාව නාරාහේන්පිට ජාතික වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයේ **IT** නොවන පාඨමාලා සඳහා **IT** විෂය ඉගැන්වීමේ කටයුතු කර ඇත.

4.9 (ඉ) අනුමත කාර්ය මණ්ඩලය අභිබවා යාමක් සිදුවී නොමැත. මෙම අධිකාරිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩලය අනුමත කරීමේදී කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන (MA 1-2) සේවා ගණයේ උපදේශක තනතුරු 1177ක් තනතුරු දරන්නාට පුද්ගලික වන සේ අනුමත කර ඇත. එම තනතුරු සීමාව තුල කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සිටි උපදේශකවරුන් එවකට එම නිලධාරීන් බඳවාගත් සුදුසුකම වන වසර 03ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ස්ථිර කිරීමට කටයුතු කර ඇත. එබැවින් , එහිදී අනුමත කාර්ය මණ්ඩලය අභිබවා යාමක් සිදුවී නොමැත.

4.10 (අ) මෙම කොන්ත්‍රාත් ආයතනය සඳහා ඉහත කී අයිතමය වෙනුවෙන් ගෙවීම් අත්හිටුවා ඇත. මේ පිළිබඳව මූලික විමර්ෂණයක් පවත්වා එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

4.10 (ආ) (i) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසාන කර භාර දී ඇති අතර, මේ වන විට පුහුණු කටයුතු ආරම්භ කර ඇත.

4.10 (ආ) (ii) මෙම ව්‍යාපෘතිය මගින් සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධිය පිෂස සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන බැවින් මේ සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ මූලික එකඟතාවය පළ කර ලිපියක් එවා ඇත. සංචාරක සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉඩම් කොටස පැවරීමට අදාලව කැබිනට් පත්‍රිකාවද ඉදිරිපත් කර ඇත.

4.10 (ආ) (iii) වර්ෂා සමයේදී මෙම භූමියට ඉහළින් පිහිටි භූමි වල ජලය බැසයාම අවහිර වන හෙයින් ඒවායේ ජලය බැසයාම අවහිර වී ඒවි ජලයෙන් යටවිය හැකිය. එහෙයින් උපදේශක ආයතනය වන ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නිර්දේශය පරිදි පස් පිරවීම වෙනුවට මතුපිට පස් තට්ටුව හා ඉහළට නෙරා ඇති කලු ගල් ගලවා ඉවත් කර පොළව මට්ටම් කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා ඝන මීටර් 1 ට රු. 12,390.00 බැගින් ඝන මීටර් 636.34 ක් සඳහා රු. 7,887,253.00 මුදල කොන්ත්‍රාත් ආයතනයට ගෙවන ලදී.

4.10 (ආ) (iv) මේ දක්වා ගංවතුර තත්වයක් හෝ ජලයෙන් යටවීමක් මෙම භූමිය සම්බන්ධයෙන් වාර්තා වී නොමැත.

4.10 (ඇ) (i) CID ආයතනයෙන් උපදේශය ලබා දීම ප්‍රමාද වීම හේතුවෙන් 2016.04.08 කැඳවන ලංසුව 2016.10.27 දින පැවැති ප්‍රසම්පාදන තීරණ කමිටු අනුව අවලංගු කරන ලදී.

4.10(ඇ) (ii) දැනට මේ සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ අවසාන තීරණය ලබා දීමට නියමිතව ඇත.

4.10 (ඇ) (iii) මෙම ව්‍යාපෘතිය 2018 වසරේ මූලික වශයෙන් නවීකරණ කටයුතු නිම කර භාවිතයට ගැනීමට හැකි වන මට්ටමට පත් කිරීමට සැලසුම් කර ඇත.

5.1 සම්පූර්ණ වාර්ෂික වාර්තාව සකස් කිරීමේ කටයුතු පරිපාලන අංශය මගින් ඉටු කරමින් පවති. එහි පාලන කොටස රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.

5.2 මුදල් හා ක්‍රම සම්ප්‍රාදන අමාත්‍යාංශය මගින් නිකුත්කර ඇති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 01/2014 ට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කොට අනුමැතිය ලබාගෙන ඇත.

5.3 (අ) ක්‍රියාකාරී සැලැස්මේ කාර්යන්ගේ ප්‍රගතියේ වෙනස්වීම් ඒ ඒ අංශ වලින් ලබා ගත යුතු වේ.

5.3 (ආ) ක්‍රියාකාරී සැලැස්මේ කාර්යන්ගේ ප්‍රගතියේ වෙනස්වීම් ඒ ඒ අංශ වලින් ලබා ගත යුතු වේ.

5.4 අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි 2018 සැලසුම් කල විගණන කටයුතු යාවත්කාලීනව සිදු කරමින් පවති

5.5 (අ) විගණන වාර්තාවේ සඳහන් අනතුර සම්බන්ධයෙන් 2015 වසරේ පත් කරන ලද තිදෙනෙකුගෙන් යුත් කමිටුව මඟින් අනාවරණය කර ඇත්තේ මෙම රිය අනතුර සිදු වී වසර 12 ක් ගත වී තිබීම හා පෙර පරීක්ෂණ වාර්තා නීතියේ මූලධර්ම වලට පටහැනිව හෝ විධිමත් ආකාරයෙන් පරීක්ෂණය නොකිරීම හේතුවෙන් ආයතනයට ප්‍රතිපූරණය කිරීමට නොහැකි වී ඇති බවයි.

එමෙන්ම මෙම සිද්ධියට වගකිව යුතු නිළධාරියෙක් පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස පත් කර තිබීමත් පරීක්ෂණ කමිටු නිළධාරීන් හා අළාභය අය කර ගත යුතු නිළධාරීන් 08 දෙනාගෙන් 06 දෙනෙකු මේ වන විට අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගොස් ඇති බවත් කමිටුව විසින් අනාවරණය කර ඇත.

2015 වසරේ පත් කරන ලද මෙම නව කමිටුවේ නිර්දේශය අනුව රජයේ විගණන අංශය විසින් මේ සම්බන්ධව කර ඇති අනාවරණයන්ද පදනම් කරගෙන නොපමාව මේ කාරණය අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමු කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරනු ඇත.

5.5 (ආ) මෙම නිළධාරියා පත්කොට ඇත්තේ අතිගරු ජනාධිපතිතුමන්ගේ නියමය පරිදි ජනාධිපති ලේකම් විසිනි.
ඔහුව සතියකට වරු 03ක් නිදහස් කොට ඇත්තේ සභාපතිතුමන්ගේ අනුමැතියෙනි. වෘත්තිය පුහුණු අධිකාරියේ පණතට අනුව සභාපතිවරයා ප්‍රධාන විධායක නිළධාරියා වන බැවින් මෙම නිදහස් කිරීම කර ඇති අතර ඔහු මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලය මඟින් අනුමත කොට ඇති දීමනාවක් ලබාගෙන ඇත.

මේ සම්බන්ධව මධ්‍යම සංස්කෘතික අරමුදල කැඳවා තිබූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් වෙත නියම කර ඇත්තේ මෙම නිළධාරියාට ගෙවන ලද දිමනාව මහාභාණ්ඩාගාරය මඟින් අනුමත කරගන්නා ලෙස. එසේම මෙම නිළධාරියා මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවය කරන බවට ප්‍රකාශ කර ඇත්තේ පූර්ණ කාලීනව නොව සතියට වරු 03ක් පමණ. උක්ත කාරණය සම්බන්ධව ජනාධිපති ලේඛම්ගෙන් විමසා උපදෙස් ලබා ගැනීම සඳහා ලිපි යොමුකර ඇති අතර මේ වන තුරු ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත.

5.5 (ඇ) අධ්‍යක්ෂ ජනරාල් තනතුර

වෘත්තිය පුහුණු අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා තිබිය යුතු බව සඳහන් වී ඇත.
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමඟ

ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර විස්සක (20) ක පළපුරුද්ද. (අවම වශයෙන් මින් වසර 5 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.)
ඒ අනුව මේ වන විට බඳවා ගෙන ඇති නිලධාරිනිය 1990 වසරේ රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාවේදී විශේෂ උපාධිය : **B.Sc Agriculture (Special)** - සහ 1995 වසරේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය **(Msc)** ලබා ඇත.
ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු 1991 සිට 2014 දක්වා අධ්‍යයන සහ තාක්ෂණික ආයතන වල කළමණාකරණ සේවා ගණයේ සහ ඊට ඉහළ විවිධ තනතුරු දරා ඇති අතර එම කාලය තුළ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, විවෘත විශ්ව විද්‍යාලය, හාඩ් උසස් තාක්ෂණ ආයතනය අම්පාර, ටව්වුඩ් පෞද්ගලික ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටමේ තනතුරු වසර 8 කට වැඩි කාලයක් හොබවා ඇත.

ලකුණු ලබා දීමේ ක්‍රමවේදයේදී අතිරේක අධ්‍යාපන / වෘත්තිය සුදුසුකම් ලෙස පිළිගත් වෘත්තිය ආයතනයක (Professional Institute) සම්පූර්ණ සාමාජිකත්වය (Membership) හෝ වරලත් (Charted) සුදුසුකම සලකනු ලබන අතර මෙම නිලධාරිනිය ශ්‍රී ලංකා ජීව විද්‍යා ආයතනයේ (Institute of Biology Sri lanka) සම්පූර්ණ සාමාජිකත්වය මෙන්ම වරලත් (Charted) සුදුසුකමද ලබා ඇත.

මේ අනුව බඳවා ගෙන ඇති නිලධාරිනිය, බඳවා ගැනීමේ පරිපාටියට අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අදාල සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇත. තවද විවෘත පුවත්පත් දැන්වීමක් පළ කර අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ස්වාධීන, පරිණත, පළපුරුදු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සම්මුඛ පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අදාළ තනතුරට බඳවාගෙන ඇත.

(ii) අධ්‍යක්ෂ (පුහුණු)

මෙම අධ්‍යක්ෂ (පුහුණු) තනතුරේ සිටි නිළධාරියා පෙර පැවති කළමණාකාරීත්වයේ තීරණයක් මත පත්කර ඇති අතර මේ වන විට අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගොස් ඇත.

(iii) අධ්‍යක්ෂ (සැළසුම් පර්යේෂණ හා සංවර්ධන)

අධ්‍යක්ෂ (සැළසුම් පර්යේෂණ හා සංවර්ධන) තනතුරේ සිටින නිළධාරිනිය වෘත්තිය පුහුණු අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව අදාල සුදුසුකම් සම්පූර්ණ කර ඇත. අදාල තනතුර සඳහා ඉල්ලුම්කරු විසින් ලබාගෙන ඇති අධ්‍යාපනය හා වෘත්තිය සුදුසුකම් පිළිබඳ විස්තරයක් පෞද්ගලික ලිපිගොණුව වෙත ඉදිරිපත් කර ඇත.

ඒ අනුව 1995 වසරේ කොළඹ විශ්ව විද්‍යාලයෙන් රසායන විද්‍යාව විශේෂවේදී(B.Sc Chemistry) ගෞරව උපාධියක් ලබා ගෙන ඇත. 2002 වසරේ දී University of London වලින් ආචාර්ය උපාධියක් (**PhD**) ලබා ගෙන ඇත ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසු කාර්මික තාක්ෂණ ආයතනයේ ඉහළ කළමණාකරණ මට්ටමේ තනතුරක අවුරුදු 05 මාස 07 ක කාලයක් සේවය කිරීම. ඊට අමතරව ඇමරිකා එක්සත් ජනපදයේ Post-Doctoral Research Fellow ලෙසද වසර 04 ක් කටයුතු කර ඇත. මෙය කළමණාකාර සේවා ගණයේ වෘත්තිය සුදුසුකමක් වන අතර අතිරේක අධ්‍යාපන/වෘත්තිය සුදුසුකමක් ද වේ.

කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් හදුන්වා දෙන ලද බඳවා ගැනීමේ පටිපාටිය අනුව ජ්‍යෙෂ්ඨ විධායක (HM 1-1) ගණයට ආචාර්ය උපාධිය සුදුසුකමක් ලෙස සඳහන් කර නොමැති වුවද අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ආචාර්ය උපාධිය සුදුසුකමක් ලෙස වසර 5 ක ඉහළ කළමණාකරණ මට්ටමේ පළපුරුද්දක් සමග සඳහන් කර ඇත

ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පහළ තනතුරක් වන අධ්‍යක්ෂ තනතුර සඳහා ආචාර්ය උපාධියක් හා පස් වසරකට වැඩි පර්යේෂණ සහ සැළසුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ප්‍රමාණවත් ලෙස උක්ත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත

ශ්‍රී ලංකාවේ කළමණාකාරීත්වයම සම්මත ක්‍රමවේදයකින් අර්ථ නිරූපනය කර නොමැත. එමනිසා ඒ ඒ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් මණ්ඩලයට ඉහළ කළමණාකාරීත්වයට අදාළ සේවා පළපුරුද්ද තීරණය වෙයි. එමනිසා පරිණත සහ පළපුරුදු සහිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලබා දී ඇති එම ලකුණු සම්බන්ධව කිසිවක් ප්‍රකාශ කළ නොහැක.

(iv) අධ්‍යක්ෂ (වෘත්තිය මාර්ගෝපදේශන, රැකියා ගතකිරීම් හා ප්‍රවර්ධන)

අධ්‍යක්ෂ (වෘත්තිය මාර්ගෝපදේශන, රැකියා ගතකිරීම් හා ප්‍රවර්ධන) තනතුර සඳහා බඳවා ගැනීමේදී වෘත්තිය පුහුණු අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇත. අදාළ තනතුර සඳහා ඉල්ලුම්කරු විසින් ලබාගෙන ඇති අධ්‍යාපනය හා වෘත්තිය සුදුසුකම් පිළිබඳ විස්තරයක් පෞද්ගලික ලිපිගොනුව වෙත ඉදිරිපත් කර ඇත.
ශ්‍රී ලංකාවේ කළමණාකාරිත්වයම යන්න සම්මත ක්‍රමවේදයකින් අර්ථ නිරූපනය කර නොමැත. එමනිසා ඒ ඒ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් මණ්ඩලයට ඉහළ කළමණාකාරිත්වයට අදාළ සේවා පළපුරුද්ද තීරණය වේ. එමනිසා පරිණත, පළපුරුදු සහ ස්වාධීන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ලබා දී ඇති එම ලකුණු සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැක.

තවද මෙම නිළධාරීන් බඳවාගැනීමේදී විවෘත පුවත්පත් දැන්වීමක් පළ කර අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ස්වාධීන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සම්මුඛ පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව අදාළ තනතුරු වලට බඳවාගෙන ඇත.

(v) නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු

අප ආයතනය විසින් සුදුසුකම් නොමැතිව නියෝජ්‍ය අධ්‍යක්ෂ දෙදෙනෙකු පත් කර නොමැත. සියළු නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් පත් කොට ඇත්තේ MM-1-1 සේවා ගණයේ වසර 10 සේවා කාලයක් සැපිරීමෙන් අනතුරුව සහ කාර්යක්ෂමතා කඩඉම සමත් වීමෙන් අනතුරුවයි.

(v) සහකාර අධ්‍යක්ෂ තනතුරු

විගණනය විසින් වාචිකව ප්‍රකාශ කළ පරිදි සහකාර අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු වන ඉනෝකා ගුණවර්ධන නැමැති නිළධාරිනිය පෙර පැවති කළමණාකාරිත්වයේ තීරණයක් මත සහකාර අධ්‍යක්ෂ සම්බන්ධීකාරක තනතුර සඳහා පත්කර ඇත. මේ වන විට එම නිළධාරිනිය පුහුණු අංශයේ සේවයේ යොදවා ඇති අතර තනතුරු නාමයද වෙනස් කිරීමට කටයුතු කරමින් පවති. විගණනය විසින් වාචිකව ප්‍රකාශකළ පරිදි අනෙක් සහකාර අධ්‍යක්ෂවරයා වන එච්.එදිරිසිංහ මහත්මිය සහකාර අධ්‍යක්ෂ (මුදල්) ලෙස බඳවා ගැනීමේදී ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇත.

(vi) නීති නිළධාරී තනතුර

මෙම නීති නිළධාරී තනතුර දරණ නිළධාරිනිය 2013.09.16 වන දින අධිකාරියේ සේවයට වාර්තා කර ඇත. ඇය 2011.12.13 වන දින ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක් වශයෙන් දිවුරුම් දී ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී (ගෞරව) උපාධියක් ලබාගෙන ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක් වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව 2011.12.13 සිට 2012.05.21 දක්වා, ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු යටතේ කනිෂ්ඨ නීතිඥවරියක ලෙස සේවය කර ඇති අතර, 2012.05.22 සිට 2013.09.03 දින දක්වා පෞද්ගලික මූල්‍ය ආයතනයක නීති නිළධාරිනිය ලෙස සේවය කර ඇත. බඳවා ගැනීමේ පටිපාටියට අනුව නීති නිළධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් වන්නේ, නීතිවේදී උපාධිය සමඟ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක වශයෙන් දිවුරුම් දී වසරක (1) සේවා පළපුරුද්දක් ලබා තිබීමයි.
ඒ අනුව, මෙම නීති නිළධාරිනිය අධිකාරියේ සේවයට වාර්තා කරන විට ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරියක ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව අවුරුදු 1 කුත් මාස 9ක කාලයක් සම්පූර්ණ කර සිටි හෙයින් බඳවා ගැනීමේ පටිපාටියේ දැක්වෙන අවශ්‍යතා සම්පූර්ණ කර ඇත.

(vii) සහකාර අධ්‍යක්ෂ (මුදල්)

අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුර සඳහා අනුමත කාර්ය මණ්ඩලයට පිටතින් බඳවාගෙන නැත. මුදල් අංශය සඳහා සහකාර අධ්‍යක්ෂ තනතුරු 05ක් අනුමත වී ඇත.

5.5 (ඇ) ආදායමට බැර කිරීම සඳහා අනුමැතිය ගැනීමට කටයුතු කරමින් පවති.

5.5 (ඉ) මූල්‍ය අක්‍රමිකතාවන්ට එරෙහිව වැඩ තහනම් කළ නිළධාරියාට ගෙවන ලද වැටුප් අයකර ගැනීම සඳහා DMR 1029/2014 දරණ මුදල් අය කර ගැනීමේ (Money Recovery Matter) නඩුව කොළඹ දිසා අධිකරණයේ පවරා ඇති අතර මේ වන විට එය විභාග වෙමින් පවති.
තව ද මේ සම්බන්ධව දැනට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මඟින් ද පරීක්ෂණ සිදු කරමින් පවති.
මෙම නිළධාරියාට වැටුප් වශයෙන් රු.1,711,961/= ක මුදලක් ගෙවා ඇති බව පිළිගනිමි. මෙම මුදල් අය කර ගැනීම සඳහා දිසා අධිකරණයේ මෙම නිළධාරියාට විරුද්ධව නඩුවක් පවරා මේ වන විට විභාග වෙමින් පවති.

5.5 (ඊ) පෙර වර්ෂ ගෙවීමක් බැවින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවති.

5.6 ආයතනික අවශ්‍යතා අනුව ඇස්තමේන්තු ගත අයවැය ප්‍රතිපාදන වල සංශෝධනයන් කිරීමට සිදු වූ අතර මේ සඳහා විධිමත් පාලක මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව විගණන විමසුමේ සඳහන් පරිදි විචල්‍යතාවන් නිරීක්ෂණය නොවේ.

6 (අ) මේ වන විට බඳවා ගැනීම් නිසි ක්‍රමවේදයන්ට අනුව සිදුකරමින් පවති. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ විධිමත්ව ක්‍රියාත්මක කිරීමටත් වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුකූලව විධිමත්ව ක්‍රියාත්මක කිරීමටත් කටයුතු සිදු කරනු ඇත.

6 (ආ) මෘදුකාංගයට තොරතුරු ඇතුළත් කරමින් පවති.

6 (ඇ) දැනට රේඛිත චෙක්පතක් මඟින් ආධුනික දීමනා ගෙවීම සිදු කරනු ලබයි. දැනට පාඩමාලා ගාස්තු අය කරනු නොලබයි. වෙනමම ගිණුම් තබා ඇත.

6 (ඉ) 2018 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.